# වාර්ෂික වාර්තාව
## வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

# 2024

## ටවර් හෝල් රඟහල පදනම
### டவர் மண்டப அரங்க மன்றம்
## Tower Hall Theatre Foundation

බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

புத்தசாசன மத மற்றும் கலாச்சார அலுவல்கள் அமைச்சு

**Ministry of Buddhasasana Religious and Cultural Affairs**

# පටුන


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැදින්වීම ........................................................................ 4-5
1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර,අරමුණු ........................................... 6
1.3 ප්‍රධාන කාර්යයන් ........................................................................ 7
1.4 සංවිධාන සටහන........................................................................ 8
1.5 ටවර් හෝල් රඟහල පදනම යටතේ පවතින ප්‍රධාන අංශ............................... 9

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම........................................................ 10-32

පරිච්ඡේදය 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය................................................................ 33
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය.............................................................. 34-36
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය............................................................... 37-38
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්....................................................................... 39-59
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය...................................................... 60
3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.................. 60
3.7 මු.රෙ 208 ප්‍රකාරව,මෙම ආයතනයට ප්‍රධානය කරන ප්‍රතිපාදන.......................... 60
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ................................ 61
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව........................................................... 62-68

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 කාර්ය සාධන දර්ශක........................................................................ 69-72

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමෙ කාර්ය සාධනය

5.1 හදුනාගන්නාලද තිරසාර සංවර්ධන අරමුණු.............................................. 73
5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීම ජයග්‍රහණය හා අභියෝග.................. 74-75

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය.............................................................. 76-80
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ
අතිරික්තය බලපාන ආකාරය................................................................... 80
6.3 මානව සම්පත් සංවර්ධනය.................................................................. 81

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව......................................................... 82-88

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරංශය

### 1.1 හැඳින්වීම

*හැඳින්වීම*

ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම, නාට්‍ය, නැටුම් හා සංගීතය ඇතුළු ප්‍රාසාංගික කලාවන් පිළිබඳ පර්යේෂණ කිරීම ඒවා දිරිගැන්වීම සහ ටවර් රඟහල ජාතික රඟහලක් ලෙස ප්‍රයෝජනයට ගැනීම මුඛ්‍ය පරමාර්ථ කොට ගෙන නාට්‍ය හා රංගකලාවන් වෙනුවෙන් ස්ථාපිත ටවර් හෝල් රඟහල පදනම 1978 අංක 01 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කරන ලද, කරුණු පහකින් සමන්විත අරමුණු ඉටු කර ගැනීම සඳහා පිහිටවූ ආයතනයකි.

ටවර් හෝල් රඟහල පදනම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමියගේ සභාපතිත්වයෙන් යුතු පහළොස් දෙනෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් මඟින් පාලනය වේ.

ටවර් හෝල් රඟහල පදනම 2024 වර්ෂය පුරාවට වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදි.

- ටවර් නාට්‍ය පාසලේ සිංහල මාධ්‍ය පාඨමාලාව සඳහා මෙම වර්ෂය තුළ සිසුන් 67 දෙනෙකු ඇතුලත්කරගත් අතර යාපනයේ ආරම්භ කල දෙමළ මාධ්‍ය පාඨමාලාව සඳහා සිසු සිසුවියන් 45 දෙනෙකු ඇතුලත් කර ගන්නා ලදි.

- ඒ අනුව ශ්‍රී ලංකා නාට්‍ය හා රංගකලා ක්ෂේත්‍රයට නවක පුහුණු ලාභීන් ලෙස සිසු සිසුවියන් 112 දෙනෙකු සිංහල හා දෙමළ මාධ්‍යන්ගෙන් ඇතුලත් කර ගැනීමට හැකි විය.එමෙන්ම SLQF 3 හා 4 සම්පූර්ණ කල සිසු සිසුවියන් 96 දෙනෙකු සඳහා නාට්‍ය හා රංගකලාව පිළිබඳ උසස් ඩිප්ලෝමා සහතික ප්‍රදානය කරන ලදි.

- ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ආරම්භ කරන ලද රංගනය පිළිබඳ වෘත්තීය පාඨමාලාව (ACTOR – NVQ 04) සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සිසු සිසුවියන් 27 දෙනෙකු තෝරාගෙන අධ්‍යන කටයුතු ආරම්භ කරන ලදි.මෙමගින් නාට්‍ය, ටෙලි නාට්‍ය, චිත්‍රපට හා දැන්වීම් සඳහා අවශ්‍ය කෙරෙන පුහුණු වෘත්තිය රංගන ශිල්පීන් බිහිකිරීම සිදු කෙරේ.

- පදනම සතු රංගශාලා සඳහා ප්‍රේක්ෂකයන් ආකර්ෂණය කරගැනීමත් නිර්මාණකරුවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමත් අරමුණු කර ගනිමින් "අපේක්ෂාවේ වේදිකා මංගල්‍ය ටවර් නාට්‍ය උළෙල 2024" පවත්වන ලදි.

  මෙහිදී නාට්‍ය 44 ක් ප්‍රදර්ශනය කරන ලද අතර එම නාට්‍ය නැරඹීම සඳහා ප්‍රේක්ෂකයින් 5000 කට අධික සංඛ්‍යාවක් පැමිණ ඇත.

- නුර්ති,නාඩගම්,ටීටර්,ග්‍රැමෆෝන් යුගයන්හිදී ප්‍රදර්ශනය කරන ලද නාට්‍ය හා එකල ජනප්‍රිය ගීත වර්තමාන සමාජයේ රසවින්දනය,සංරක්ෂණය කිරීම අරමුණු කරගනිමින් පාසල් සිසු සුවියන්,ගුරුවරුන් හා සාමාන්‍ය ජනයා ඉලක්ක කර ගනිමින් ටවර් හෝල් රඟහල පදනම විසින් ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංග 06 ක් දිවයිනේ විවිධ ප්‍රදේශයන්හිදී පවත් වන ලදී. මෙම ප්‍රසංගය සඳහා පාසල් සිසුන්,ගුරුවරුන් හා සමාන්‍ය ජනතාව 8000 ට අධික සංඛ්‍යාවක් සහභාගී වී නිර්මාණ රසාස්වාදනය කරන ලදි.

- වේදිකා නාට්‍ය හා ප්‍රාසාංගික ක්ෂේත්‍රයට සුවිශේෂී දායකත්වයක් සැපයූ කලාකරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක ජීවනාධාර වැඩසටහනට අයත් ජ්‍යෝෂ්ඨ ශිල්පීන් සඳහා සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් රුපියල් 10,000.00ට ආසන්න වටිණාකමකින් යුත් වියලි ආහාර මල්ලක් කලාකරුවන් 122 ක් සඳහා ප්‍රදානය කරන ලදි. එමෙන්ම ඔවුන් වෙත ජීවනාධාර වශයෙන් රු 12,810,000.00 මුදලක් 2024 වර්ෂය වෙනුවෙන් ගෙවා ඇත.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

"නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලාවන්හි ගුණාත්මක සංස්කෘතියක් බිහිකිරීමෙහිලා දකුණු ආසියාවේ ප්‍රමුඛතම ආයතනයක් බවට පත්වීම"

### මෙහෙවර

නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලා සම්ප්‍රදායන් ආරක්ෂාකර ගනිමින් නව නිර්මානකරණය හා පර්යේෂණ සඳහා නිර්මානවේදීන් ඇතුළු ක්ෂේත්‍රය කෙරේ උනන්දුව දක්වන ප්‍රජාව යොමු කරවීම හා ඊට අදාල වන යටිතල පහසුකම් වැඩිදියුණු කරමින් ගුණාත්මක නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලා සංස්කෘතියක් බිහි කිරීම සඳහා අවශ්‍යවන මංපෙත් විවර කිරීම.

### අරමුණු හා පරමාර්ථ

- ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.
- රඟහල පිළිබඳ දැනුම අවබෝධය සහ එහි භාවිතය වර්ධනය කිරීම හා දියුණු කිරීම.
- රඟහල් නාට්‍ය කලාකරුවන්ට හා ශිල්පීන්ට මුදලින් උපකාර කිරීම හා නාට්‍ය කලාකරුවන් පුහුණු කිරීමෙහිලා සහාය වීම.
- ගීත නාට්‍ය, නැටුම් නාට්‍ය හා සංගීතය නිෂ්පාදනය කිරීමේ, ඒ පිළිබඳ පරීක්ෂණ කිරීමේ සහ ඒවා රඟදැක්වීමේ නියුතු වීම හා ඒ පිළිබඳ අධ්‍යාපනය ලබා දීම.
- පක්ෂග්‍රාහී දේශපාලනමය කාර්යයන් සඳහා රඟහල ප්‍රයෝජනයට නොගතයුතුවන ලෙස ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහාද සුදුසුයැයි මණ්ඩලය සලකන වෙනත් කාර්යයන් සඳහා ද ටවර් හෝල් රඟහල ජාතික සිහිවටනයක් ලෙස පුනස්ථාපනය කිරීම, ආරක්ෂා කිරීම, පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

01. වේදිකා නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලාවන්හි නියැලෙන්නන් ඇගයීම හා ඔවුන්ගේ සුභසාධන කටයුතු ඉහළ නැංවීම.

02. නාඩගම්,නූර්ති,ටීටර් යුගයේ නිර්මාණ රසාස්වාදය වෙනුවෙන් අනාගත පරපුරට දායාද කිරීම.

03. ගුණාත්මක නාට්‍ය හා ප්‍රාසාංගික කලා නිර්මාණ බිහිකිරීමට නිර්මාණවේදීන් පෙළඹවීම.

04. දේශීය නාට්‍ය හා ප්‍රාසාංගික කලාවන් ජාත්‍යාන්තරයට රැගෙනයාම හා ජාත්‍යාන්තර ප්‍රවණතා දේශීය නාට්‍ය හා ප්‍රාසාංගික කලාවන්ට හඳුන්වා දීම, පුළුල් කිරීම.

05. ටවර් හෝල් රඟහල පදනම සතු රංගශාලා හා ශබ්දාගාරය සංවර්ධනය කර දෙස් විදෙස් ජනතාව අතර ප්‍රචලිත කිරීම.

06. නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලාවන්හී ගුණාත්මක සංස්කෘතියක් බිහිකිරීම හා ප්‍රවර්ධනය කිරීම.

## 1.4 සංවිධාන සටහන

- වෝර් හෝල් රෝහල පදනමේ සංවිධාන ව්‍යුහය -



## 1.5 පදනම යටතේ පවතින ප්‍රධාන අංශ

1.5.1 පාලන හා සංවර්ධන අංශය

1.5.2 මුදල් අංශය

1.5.3 නාට්‍ය ප්‍රවර්ධන කලාකරු සුභසාධන හා වැඩසටහන් අංශය

1.5.4 දෙමළ නාට්‍ය ප්‍රවර්ධන අංශය

1.5.5 අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ අංශය

1.5.6 ටවර් හෝල් රඟහල - මරදාන

1.5.7 එල්ෆින්ස්ටන් රඟහල - මරදාන

1.5.8 රුක්මණීදේවි රංගශිල්ප කේන්ද්‍රය - මීගමුව

1.5.9 ශබ්දාගාරය - කොළඹ 07

1.5.10 නාට්‍ය හා රංගකලා පාසල (සිංහල මාධ්‍ය) - කොළඹ

1.5.11 නාට්‍ය හා රංගකලා පාසල (දමිළ මාධ්‍ය) - යාපනය

## පරිච්ඡේදය 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය “ටවර් නාට්‍ය උළෙල - 2024”

ශ්‍රී ලාංකිය ජන සමාජය සෞන්දර්යවේදය ඔස්සේ නව ප්‍රාණයකින් සක්‍රීය කර පුබුදුවාලීමේ අරමුණින් ටවර් නාට්‍ය උළෙල 2024 සාර්ථකව පවත්වන ලදි.

නාට්‍ය උළෙලෙහි ප්‍රදර්ශනය කෙරෙන නාට්‍ය තෝරා ගැනිම සඳහා විද්වත් මණ්ඩලයක් පත් කරන ලදී.

01 සෝමසිරි ඒකනායක මහතා (අධ්‍යක්ෂ සැළසුම්- ජාතික උරුම අංශය)
02 මහාචාර්ය අනුර වික්‍රමසිංහ මහතා
03 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්ද්‍රසිරි බෝගමුව මහතා
04 අසංක ඉශාන් දයාපාල මහතා

අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය ටවර් නාට්‍ය උළෙල 2024 සඳහා දිගු නාට්‍ය 12 ක් කෙටි නාට්‍ය 24 ක්, ළමා



නාට්‍ය 04 ක් සහ සමස්තලංකා පාසල් නාට්‍ය තරඟාවලියේ ජයග්‍රාහි නාට්‍ය 04 ක් ඇතුළු නාට්‍ය 44 ක් ප්‍රදර්ශනය සඳහා තෝරා ගන්නා ලදි.




ප.ව. 3.00 ට මරදාන එල්ෆින්ස්ටන් රඟහල ඉදිරිපිටින් නාට්‍ය පෙරහැරක් ආරම්භ කර ටෙක්නිකල් හංදිය, පංචිකාවත්ත වටරවුම හරහා නැවත එල්ෆින්ස්ටන් රඟහල දක්වා පැමිණියේය. මේ සඳහා නාට්‍ය ශිල්පින්, නාට්‍ය පාසලේ විද්‍යාර්ථීන්,මාධ්‍යවේදින් ටවර්පදනමේ නිලධාරින්

මෙම නාට්‍ය උළෙල පිළිබඳ පූර්ව ප්‍රචාරක වැඩසටහනක් ලෙස 2024 පෙබරවාරි 09 වන දින ඇතුළු 300 ක පමණ පිරිසක් සහභාගිවිය.







අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය ටවර් නාට්‍ය උළෙල 2024.02.10 වන දින සිට 2024.02.21 වන දින දක්වා මරදාන ටවර් රඟහලේදි හා එල්ෆින්ස්ටන් රඟහලේදි ප.ව 3.30 ට හා ප.ව 6.30 ට ප්‍රදර්ශනය කළ අතර, පාසල් ළමා නාට්‍ය 2024.02.20 වන දින හා 21 වන දින පෙ.ව 10.00 ට ප්‍රදර්ශනය කරන ලදි.





මෙම නාට්‍ය උළෙල සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දුන් අතර, දින 10 ක් පුරාවට ප්‍රේක්ෂකයින් 5000 කට වැඩි ප්‍රමාණයක් නාට්‍ය නැරඹීමට පැමිණ ඇත.



## ටවර් රංග යාත්‍රා - අධ්‍යාපනික රසවින්දන වැඩසටහන

දේශිය නාට්‍ය කලාවේ ප්‍රවර්ධනය උදෙසා අනාගත පරපුර නාට්‍ය හා රංගකලාව පිළිබඳ අවබෝධය, රසවින්දනය හා කුසලතාවයන්ගෙන් පෝෂණය කිරිම වෙනුවෙන්, ලාංකිය පාසල් ප්‍රජාව වෙත ටවර් රංගයාත්‍රා අධ්‍යාපනික රසවින්දන වැඩසටහන් පවත්වනු ලබයි.



දේශිය නාට්‍ය කලාවේ ආරම්භයේ සිට වර්තමානය දක්වා නාට්‍ය කලාවේ විකාශය පිළිබඳව අධ්‍යාපනික රසවින්දන වැඩසටහනක් ලෙස මෙම ටවර් රංග යාත්‍රා වැඩසටහන නිර්මාණය කර ඇත.

මෙම ප්‍රසංගය ප්‍රවීන රංගන ශිල්පී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රසන්නජිත් අබේසූරිය, තරංගා කුමාරි කරුණානායක, ඉන්දික ජයසිංහ, ඉවන්කා පීරිස්, චමින්ද මැදගෙදර, ශාන්ත පීරිස්, මලිත් අනුරාධ, නිරෝෂන් අමරසිංහ යන ප්‍රවීණ ශිල්පීන් හා සහය ශිල්පින් ලෙස රෝයි අමරසිංහ සහ උපේක්ෂා ලියනගේ යන ශිල්පීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වේ.

2024 වර්ෂයේ ටවර් රංගයාත්‍රා වැඩසටහන් 06 ක් දිවයිනේ පාසල් 06 ක දි ප්‍රදර්ශනය කරන ලදි. සෑම දර්ශනයක්ම පෙ.ව 10.00 සිට ප.ව 12 දක්වා පැය දෙකක කාල සිමාවක් තුල සජීවීව රංගගත කරන ලදි.






- **2024.06.25** වන දින කඩවත **විද්‍යාලෝක විද්‍යාලය.**
- **2024.07.16** වන දින **සූරියවැව ජාතික පාසල.**
- **2024.07.17** වන දින **රත්ගම දේවපතිරාජ විද්‍යාලය.**
- **2024.08.05 වන දින ඇඹිලිපිටිය කාවන්තිස්සපුර මහා විද්‍යාලය.**

- **2024.11.05** වන දින **ගිරිඋල්ල ගැමුණු මහා විද්‍යාලය.**
- **2024.11.11** වන දින **බණ්ඩාරවෙල ශා/ජෝෂප් විද්‍යාලය.**





මෙම සෑම දර්ශනයක් සඳහාම නාට්‍ය හා රංගකලාව සහ සෞන්දර්ය විෂයන් හදාරන එම පාසල්වල සිසු සිසුවියන් මෙන්ම අවට විද්‍යාලවල සිසුන් හා ආචාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ගේ ඉහල සහභාගිත්වයක් පැවැති බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ආරම්භ කරන ලද
## රංගනය පිළිබඳ වෘත්තීය පාඨමාලාව - **ACTOR** (**NVQ 4**)

වෘත්තීය නිපුනතාවයෙන් යුතු රංගන ශිල්පීන් ශිල්පිනියන් දැයට දායාද කිරීම උදෙසා (**ACTOR - NVQ 4**) රංගනය පිළිබද වෘත්තීය පාඨමාලාව, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියමයන්ට හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරිමේ අධිකාරියේ ජාතික නිපුණතා සම්මතයන්ට අනුව ටවර් හෝල් රඟහල පදනම විසින් ආරම්භ කරන ලදි. දේශිය නාට්‍ය කලාවේ ප්‍රවර්ධනය උදෙසා දැනුමින්, කුසලතාවයෙන් හා අවබෝධයෙන් පරිපූර්ණ නිර්මාණශිලි රංගන ශිල්පින් හා ශිල්පිනියන් ශ්‍රිලාංකිය රංගන ක්ශේත්‍රයන් වෙත දායාද කිරිම වෙනුවෙන් රංගනය පිළිබද වෘත්තීය පාඨමාලාව (**NVQ 4**) ක්‍රියාත්මකවේ.

### <u>2024 වර්ෂයේ පාඨමාලාව සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීම</u>

වයස අවු 16 ට වැඩි ශ්‍රිලාංකේය ස්ත්‍රි පුරුෂ දෙපක්ෂයටම මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කළහැකි අතර, රංගනයට උනන්දුවක් කැමැත්තක් දක්වන සහජ දක්ෂතාවයෙන් හෙබි අයදුම් කරුවන් සම්මුඛ පරික්ෂනයක් මගින් තෝරා ගැනීම සිදු කරනු ලබයි.

2024. 03 .23 වන දින රංගන පාඨමාලාවේ සිසුන් තොරා ගැනීමට  අදාල සම්මුඛ පරික්ෂණය පැවැත්වු අතර, පරික්ෂණ මණ්ඩලය සඳහා ප්‍රවින රංගන ශිල්පි පාලිත සිල්වා, කථිකාචාර්ය උෂාන් පොර්රා යන මහත්වරුන් සහභාගි විය.

සම්මුඛ පරික්ෂණය සඳහා අයදුම් කරුවන් 34 දෙනෙකු අයදුම් කර තිබු අතර, ඒ අතරින් රංගන පාඨමාලාව සඳහා 27 දෙනෙකු තෝරා ගන්නා ලදි. ඒ අනුව 2024. 03 23 වන දින රංගන පාඨමාලාවේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදි.

### <u>රංගන පාඨමාලාවේ අචාර්ය මණ්ඩලය</u>

- ❖ මහාචාර්ය මංගල සේනානායක මහතා
- ❖ අචාර්ය සෙනේෂ් දිසානායක බණ්ඩාර මහතා
- ❖ කථිකාචාර්ය උෂාන් පොර්රා මහතා
- ❖ ප්‍රවින රංගන ශිල්පි පාලිත සිල්වා මහතා
- ❖ කථිකාචාර්ය සමන්ලතා පුශ්පකුමාරි මහත්මිය
- ❖ කථිකාචාර්ය දේවාංගනි දිසානායක මහත්මිය



මෙම රංගනය පිළිබද (**NVQ 4**) වෘත්තීය පාඨමාලාවේ අධ්‍යයන කළමනාකරණ මණ්ඩලය ලෙස  මහාචාර්ය මංගල සේනානායක මහතා, ආචාර්ය සෙනේෂ් දිසානායක බණ්ඩාර මහතා, ප්‍රවින රංගන ශිල්පි පාලිත සිල්වා මහතා, ආචාර්ය අජිත් පොල්වත්ත මහතා යන අය කටයුතු කරනු ලබයි.

සෑම සෙනසුරාදා දිනකම පෙ.ව 8.30 සිට ප.ව 5.00 දක්වා ටවර් හෝල් රඟහල පදනම ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී පාඨමාලාව පැවැත්වේ.





## ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංගය - හයවැනි දිගහැරුම

ශ්‍රී බුද්ධ වර්ෂ 2568 වන වෙසක් මංගල්‍ය වෙනුවෙන් සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය හා බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලැබූ ‟රාජ්‍ය වෙසක් උත්සවය‟ සඳහා ‟ටවර් ප්‍රභාෂ්වර‟ නූර්ති ජවනිකා ඇතුළත් බොදු බැති ගී ප්‍රසංගය 2024.05.24 මාතලේ ශ්‍රී ධර්මරාජ පිරිවෙන් විහාරස්ථායේ දී පැවැත්වුණි.




රත්නශීලා පෙරේරා මහත්මිය, කාංචනමාලා මහවිතාන මහත්මිය, රවින්ද්‍ර කෝදාගොඩ මහතා, ජීවන් හඳුන්නෙත්ති මහතා, උදේනි චන්ද්‍රසිරි මහතා, කුමාරි පෙරේරා මහත්මිය, ෆර්නි රෝෂිණී මහත්මිය, ඩබ්. නිමල් ජයසිංහ මහතා, රුවන් දනන්සූරිය මහතා, චමින්ද මැදගෙදර මහතා, පැතුම් දනන්සූරිය මහතා, සුගත් මෛත්‍රී මහතා, වසන්තා විජේසිංහ මහත්මිය, උපේක්ෂා උඩගෙදර මහත්මිය, ශ්‍රීපාලි අමරසිංහ මහත්මිය, විල්ෆ්‍රඩ් පෙරේරා මහතා ඇතුළු ජනප්‍රිය රංගන හා ගායන ශිල්පීන් රැසක් මෙම ප්‍රසංග සඳහා සහභාගී විය.

රංජිත් යාපා ද අල්විස් මහතා ප්‍රමුඛ ටවර් වාද්‍ය වෘන්දය සංගීතය සැපයූ අතර, කථනය ප්‍රවීණ නිවේදක ගාමිණී මෙරින්නගේ මහතා විසිනි.

මෙම අවස්ථාව සඳහා මාතලේ ප්‍රදේශවාසීන්, පාසල් හා දහම් පාසල් සිසු දරු දැරියන්, රාජ්‍ය නිලධාරීන් ඇතුළුව අති විශාල ජනකායක් සහභාගී විය.










## ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංගය - හත්වැනි දිගහැරුම

ශ්‍රී බුද්ධ වර්ෂ 2568 වන වෙසක් මංගල්‍ය අති උත්කර්ෂවත් අන්දමින් සැමරීම උදෙසා අග්‍රාමාත්‍ය කාර්යාලය, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය හා ධර්මායතනය මගින් සංවිධානය කරනු ලැබූ **"බෞද්ධාලෝක" වෙසක් කලාපය** වෙනුවෙන් **2024.05.25 දින පස්වරු 8.00 සිට පසුදින පහන් වනතුරු බෞද්ධාලෝක මාවතේ පිහිටි ධර්මායතනය ඉදිරිපිට දී** ටවර් යුගයේ නූතන සම්ප්‍රාප්තිය **"ටවර් ප්‍රභාෂ්වර" නූර්ති ජවනිකා ඇතුළත් බොදු බැති ගී ප්‍රසංගය** පැවැත්විණි. මෙවර ප්‍රසංගය නැරඹීම සඳහා විශාල ජනකායක් බෞද්ධාලෝක මාවතට එක් රොක් විය.




රත්නශීලා පෙරේරා, කාංචනමාලා මහවිතාන, සුදත් සමරසිංහ, රවින්ද්‍ර කෝදාගොඩ, තරංගා කුමාරි, ජීවන් හඳුන්නෙත්ති, උදේනි චන්ද්‍රසිරි, කුමාරි පෙරේරා, ෆර්නි රෝෂිණී, ඩබ්. නිමල් ජයසිංහ, රුවන් දනන්සූරිය, චමින්ද මැදගෙදර, පැතුම් දනන්සූරිය, සුගත් මෛත්‍රී, වසන්තා විජේසිංහ, ශ්‍රී පාලි අමරසිංහ, විල්ෆ්‍රඩ් පෙරේරා ඇතුළු ජනප්‍රිය රංගන හා ගායන ශිල්පීන් රැසක් මෙවර ප්‍රසංගය සඳහා සහභාගී විය.

ප්‍රසංග සඳහා සංගීතය සපයනු ලැබුවේ, ටවර් ශිල්පී රංජිත් යාපා ද අල්විස් ප්‍රමුඛ ටවර් වාද්‍ය වෘන්දය මගිනි. කථනය ප්‍රවීණ නිවේදක ගාමිණී මෙරින්නගේ විසිනි.

## ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංගය - අටවැනි දිගහැරුම

ඇහැටුවැව ජාතික පාසලේ විදුහල්පතිනියගේ ඉල්ලීම පරිදි, ටවර් යුගයේ නූතන සම්ප්‍රාප්තිය ''ටවර් ප්‍රභාෂ්වර'' නූර්ති ජවනිකා ඇතුළත් ප්‍රාසාංගික අත්දැකීම 2024.06.18 දින පස්වරු 6.00 සිට ඇහැටුවැව බණ්ඩාරනායක ජාතික පාසලේ සිසු දරු දැරියන් හා ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා ඇහැටුවැව බණ්ඩාරනායක ජාතික පාසලේ සිසු සිසුවියන්, ගුරුභවතුන්, ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ප්‍රදේශවාසීන් ඇතුළු 2000 කට අධික ප්‍රේක්ෂක ප්‍රතිචාර මැද අතිසාර්ථක අන්දමින් පැවැත්වීමට හැකි විය.

ටවර් යුගයේ බිහි වූ කලා නිර්මාණ වර්තමාන පරපුර වෙත දායාද කිරීමත්, ඒවා රසවිඳීමට සැලැස්වීමත්, සංරක්ෂණය කිරීමත් යන ටවර් හෝල් රඟහල පදනමේ මුඛ්‍ය අරමුණු සාක්ෂාත් කිරීම උදෙසා නිර්මාණය කරන ලද මෙම ප්‍රසංගය, සෞන්දර්ය විෂයන් හා සිංහල විෂය හදාරනු ලබන පාසල් සිසු සිසුවියන්ට හා එම විෂයයන් උගන්වනු ලබන ගුරුභවතුන්ට ද එක සේ වැදගත් වේ. එමෙන් ම ප්‍රේක්ෂක ජනතාවගේ රසාස්වාදය වර්ධනය කිරීම උදෙසා ම නිර්මාණය වූ ප්‍රසංගයකි.

ශාස්ත්‍රපති සුදත් සමරසිංහ, ඩබ්. නිමල් ජයසිංහ, රුවන් දනන්සූරිය, රත්නශීලා පෙරේරා, කාංචනමාලා මහවිතාන, ඉවංකා පීරිස්, තරංගා කුමාරි, ජීවන් හඳුන්නෙත්ති, උදේනි චන්ද්‍රසිරි, කුමාරි පෙරේරා, ෆර්නි රෝෂිණී, චමින්ද මැදගෙදර, පැතුම් දනන්සූරිය,

සුගත් මෛත්‍රී, විල්ෆ්‍රඩ් පෙරේරා ඇතුළු ජනප්‍රිය රංගන හා ගායන ශිල්පීන් රැසකගේ සහභාගීත්වයෙන් මෙවර ප්‍රසංගය හැඩ විය.

ප්‍රසංග සඳහා සංගීතය සපයනු ලැබුවේ, රංජිත් යාපා ද අල්විස් ප්‍රමුඛ ටවර් වාද්‍ය වෘන්දය මගිනි. කථනය ප්‍රවීණ නිවේදක ගාමිණී මෙරින්නගේ විසිනි.









## ටවර් ප්‍රභාස්වර ප්‍රසංගය - නමවැනි දිගහැරුම

අරලගංවිල විලයාය ජාතික පාසලේ විදුහල්පතිගේ ඉල්ලීම පරිදි, ටවර් යුගයේ නූතන සම්ප්‍රාප්තිය "ටවර් ප්‍රභාෂ්වර" නූර්ති ජවනිකා ඇතුළත් ප්‍රාසාංගික අත්දැකීම 2024.08.14 අරලගංවිල විලයාය ජාතික පාසලේ සිසු දරු දැරියන් හා අරලගංවිල ප්‍රදේශයේ අනෙකුත් පාසල්හි දරු දැරියන්, දෙමව්පියන් ඇතුළු ප්‍රදේශවාසීන් වෙනුවෙන් අරලගංවිල මහවැලි ප්‍රතිභා ශාලාවේ දී පැවැත්විණි.




ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ, නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමාව ලබා , මේ වන විටත් ක්ෂේත්‍රයේ සක්‍රීයව නියැලෙන ජනප්‍රිය ගායන හා රංගන ශිල්පීන්ගේ සහභාගීත්වයෙන් මෙවර ප්‍රසංගය හැඩ විය.



මේ සඳහා ටවර් යොවුන් වාද්‍ය වෘන්දය මගින් සංගීතය සැපයූ අතර, කථනය ප්‍රවීණ ගායන හා රංගන ශිල්පී යොහාන් රණසිංහ මහතාගෙනි.

මෙම ප්‍රසංගය නැරඹීම සඳහා විලයාය ජාතික පාසලේ සිසු දැරු දැරියන්, විදුහල්පතිතුමා, අවට පාසල්හි සිසු දරු දැරියන්, විදුහල්පතිවරුන්, ආචාර්ය මණ්ඩලය, දෙමව්පියන්, ප්‍රදේශවාසීන්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විජයබාපුර කලාපයේ කොට්ඨාශ කළමණාකාරතුමා, රඹකැන්ඔය කලාපයේ නියෝජ්‍ය නේවාසික කළමණාකාරතුමා, මහා සංඝරත්නය ඇතුළු 1000 කට අධික පිරිසක් සහභාගී විය.







## ටවර් ප්‍රභාස්වර ප්‍රසංගය - දසවැනි දිගහැරුම

මාතලේ ශ්‍රී පුණ්‍යවර්ධන සමිතියේ ඉල්ලීම පරිදි, ටවර් හෝල් රඟහල පදනම මගින් නිෂ්පාදිත ටවර් යුගයේ නූතන සම්ප්‍රාප්තිය “ටවර් ප්‍රභාෂ්වර“ නූර්ති ජවනිකා ඇතුළත් ප්‍රාසාංගික අත්දැකීම 2024.09.12 දින පස්වරු 6.00 සිට මාතලේ සංචාරක හෝටල් ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා මාතලේ හා ඒ අවට 1500 කට අධික ජනකායක් සහභාගී විය.

ටවර් යුගයේ බිහි වූ කලා නිර්මාණ වර්තමාන පරපුර වෙත දායාද කිරීමත්, ඒවා රසවිදීමට සැලැස්වීමත්, සංරක්ෂණය කිරීමත් යන ටවර් හෝල් රඟහල පදනමේ මුඛ්‍ය අරමුණු සාක්ෂාත් කිරීම උදෙසා නිර්මාණය කරන ලද මෙම ප්‍රසංගය, සෞන්දර්ය විෂයන් හා සිංහල විෂය හදාරනු ලබන පාසල් සිසු සිසුවියන්ට හා එම විෂයයන් උගන්වනු ලබන ගුරුභවතුන්ට ද එක සේ වැදගත් වේ. එමෙන් ම ප්‍රේක්ෂක ජනතාවගේ රසාස්වාදය වර්ධනය කිරීම උදෙසා ම නිර්මාණය වූ ප්‍රසංගයකි.

ශාස්ත්‍රපති සුදත් සමරසිංහ, රත්නාලාලී ජයකොඩි, ඩබ්. නිමල් ජයසිංහ, රුවන් දනන්සූරිය, රත්නශීලා පෙරේරා, කාංචනමාලා මහවිතාන, ඉවංකා පීරිස්, තරංගා කුමාරි, ජීවන් හඳුන්නෙත්ති, උදේනි චන්ද්‍රසිරි, කුමාරි පෙරේරා, ෆර්නි රෝෂිණී, චමින්ද මැදගෙදර,

පැතුම් දනන්සූරිය, සුගත් මෛත්‍රී, විල්ෆ්‍රඩ් පෙරේරා ඇතුළු ජනප්‍රිය රංගන හා ගායන ශිල්පීන් රැසකගේ සහභාගීත්වයෙන් මෙවර ප්‍රසංගය හැඩ විය.

ප්‍රසංග සඳහා සංගීතය සපයනු ලැබුවේ, රංජිත් යාපා ද අල්විස් ප්‍රමුඛ ටවර් වාද්‍ය වෘන්දය මගිනි. කථනය ප්‍රවීණ නිවේදක ගාමිණී මෙරින්නගේ විසිනි.

## ටවර් ප්‍රභාස්වර ප්‍රසංගය - එකලොස්වැනි දිගහැරුම

ටවර් හෝල් රඟහල පදනම, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ රඹකැන්ඔය කලාපය හා ඒකාබද්ධව, රිදීමාලියද්ද කොට්ඨාශයේ කාන්තා කුඩා කණ්ඩායම් 234 ක සාමාජිකාවන් 2564 දෙනෙකු වෙනුවෙන්, ටවර් යුගයේ නූතන සම්ප්‍රාප්තිය “ටවර් ප්‍රභාෂ්වර“ නූර්ති ජවනිකා ඇතුළත් ප්‍රාසාංගික අත්දැකීම 2024.11.06 දින පස්වරු 5.00 ට රිදීමාලියද්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පැවැත්විණි.

ටවර් යුගයේ දී රඟදැක්වූ නූර්ති, නාඩගම්, ටීටර් හා ග්‍රැමර්ෆෝන් ගීත වලින් සමන්විතව ජවනිකා ප්‍රසංගයක් ලෙසින් නිර්මාණය කර ඇති මෙම ප්‍රසංගය, නාට්‍ය හා රංගකලා ක්ෂේත්‍රය පිළිබඳ දැනුම, අවබෝධය මෙන් ම විශේෂයෙන් ම ප්‍රේක්ෂක රසාස්වාදය ලබාදීම උදෙසාම නිර්මාණය වූවකි.

ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමාව අවසන් කළ, තරුණ තරුණියන්ගේ සහභාගීත්වයෙන් මෙවර ප්‍රසංගය විය.

ටවර් වාද්‍ය වෘන්දය මගින් සංගීතය සැපයූ අතර, කථනය ප්‍රවීණ ගායන හා රංගන ශිල්පී යොහාන් රණසිංහ ගෙනි.

## පාසල් සිසුන් සඳහා පුහුණු වැඩමුළුවක් පැවැත්වීම



ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාවේ ආරම්භය හා විකාශනය නව නාට්‍ය කලාවක් බිහිවීම නාට්‍ය නිර්මාණ කෙරෙහි බලපෑ ජන කවිය , ජනගායනය ආදීය පිළිබඳව නාට්‍ය හා රංග කලාව හදාරනු ලබන බකමූණ මහසෙන් මධ්‍ය මහා විද්‍යාලයේ සිසු සිසුවියන්ට හා ඒ අවට පාසල් සිසු සිසුසිසුවියන් වෙනුවෙන් 2024.11.20 දින පෙරවරු 10.00 සිට ප.ව 01.00 දක්වා පුහුණු වැඩමුළුවක් පවත් වන ලදී.





## ටවර් ප්‍රභාස්වර ප්‍රසංගය - දොළොස්වැනි දිගහැරුම

ටවර් හෝල් රඟහල පදනම, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මොරගහකන්ද කලාපය හා ඒකාබද්ධව, බකමූණ මහසෙන් මහා විද්‍යාලයේ දූ දරුවන් වෙනුවෙන්, ටවර් යුගයේ නූතන සම්ප්‍රාප්තිය “ටවර් ප්‍රභාෂ්වර“ නූර්ති ජවනිකා ඇතුළත් ප්‍රාසාංගික අත්දැකීම 2024.11.20 දින පස්වරු 3.00 ට බකමූණ මහසෙන් මහා විද්‍යාලයේ දී පැවැත්විණි.

ටවර් යුගයේ දී රඟදැක්වූ නූර්ති, නාඩගම්, ටීටර් හා ග්‍රැමර්ෆෝන් ගීත වලින් සමන්විතව ජවනිකා ප්‍රසංගයක් ලෙසින් නිර්මාණය කර ඇති මෙම

ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමාව අවසන් කළ, තරුණ තරුණියන් මේ සඳහා සම්පත්දායකත්වය ලබාදුන් අතර, ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංගය හැඩකිරීම සඳහා ද ඔවුන්ගේ දායකත්වය ලබාදීම විශේෂත්වයක්.

ටවර් වාද්‍ය වෘන්දය මගින් සංගීතය සැපයූ අතර, කථනය ප්‍රවීණ ගායන හා රංගන ශිල්පී යොහාන් රණසිංහ ගෙනි. මෙම ප්‍රසංගය සඳහා ටවර් හෝල් රඟහල පදනම විසින් රුපියල් ලක්ෂ 06 කට අධික මුදලක් වැය කරන ලදී.

මෙම අවස්ථාව සඳහා හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂිකා ඩබ්.එම්.එල්.සී.කේ. වාසලමුදලි, බකමූණ



ප්‍රසංගය, නාට්‍ය හා රංගකලා ක්ෂේත්‍රය පිළිබඳ දැනුම, අවබෝධය මෙන් ම රසාස්වාදය ලබාදීම උදෙසාම නිර්මාණය වූවකි.

මීට සමගාමීව එදින පෙරවරු 10.00 සිට නාට්‍ය හා රංගකලාවේ ආරම්භය, විකාශය හා නව නාට්‍ය කලාව පිළිබඳවත්, ඒ හා බැඳුණු ජන කවිය, ජන ගායනා පිළිබඳවත් වැඩමුළුවක් හා නාට්‍ය හා රංගකලා විෂය හදාරනු ලබන දූ දැරුවන් වෙනුවෙන් අංග රචනය හා වේදිකා ආලෝක කරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් ද පැවැත්විණි.

මහසෙන් මහා විද්‍යාලයේ විදුහල්පති උපාලි වත්තෙගෙදර, ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන) නිපුණ දිසානායක, නියෝජ්‍ය අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන, කලාකරු සුභ සාධන හා වැඩසටහන්) චන්දන විජේසුන්දර බණ්ඩාර, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මොරගහකන්ද කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර ආර්.එම්.කේ.බී. රන්දෙණිය, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකාර (සංවර්ධන) එස්.ඒ. අර්ෂා උදයංගනී යන මහත්ම මහත්මීන් සහ බකමූණ මහසෙන් මහා විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය හා සිසු දරු දැරියන් සහභාගී විය.





## සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් කලාකරුවන් සඳහා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය මලු ප්‍රදානය කිරීම

ටවර් හෝල් රඟහල පදනම මඟින් ක්‍රියාත්මක කරනු ලබන වියපත් කලාකරුවන් සඳහා වන මාසික ජීවනාධාර වැඩසටහනට ඇතුලත්ව සිටින වියපත් කලාකරුවන්ට ඔවුන්ගේ පවුල්වල අය සමඟ සිංහල අලුත් අවුරුද්ද සැමරීම සඳහා 2024 අප්‍රේල් මාසයේදී රු10,000/- කට ආසන්න වටිනාකමකින් යුත් වියලි ආහාර සහිත තෑගි මල්ලක් පිරිනමන ලදී. මේ සඳහා වූ වියලි ආහාර ද්‍රව්‍ය අනුග්‍රාහක ආයතන වලින් ලබාගන්නා ලද අතර, එහිදී කලාකරුවන් 122 ක් සඳහා තෑගි මලු ප්‍රදානය කරන ලදී.





අවුරුදු තෑගි ලබාදීමේ උත්සවය 2024.04.08 දින අරලියගහ මන්දිරයේ දී ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මේ අවස්ථාව සඳහා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා හා එම අමාත්‍යාංශයේ ලේකම් හා අග්‍රාමාත්‍ය ලේකම්තුමා හා ප්‍රවීණ කලාකරුවන් හා අනුග්‍රාහක ආයතන නිලධාරීන් හා වියපත් කලාකරුවන්ගේ පවුල්වල සාමාජිකයින් හා ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලය ඇතුළු විශාල පිරිසක් සහභාගී විය.



## සිංහල මාධ්‍ය නාට්‍ය හා රංගකලා පාසල

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමකින් ඇති කර ගත් එකඟතාවය මත මෙම පාඨමාලාව ක්‍රියාත්මක වන අතර, නාට්‍ය හා රංගකලාව පිළිබඳ දෙවර්ෂ පූර්ණකාලීන උසස් ඩිප්ලෝමාව (SLQF) 3 හා (SLQF) 4) ලබා ගන්නා සිසුන් ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ද්විතියික හා තෘතියික අධ්‍යාපන අධ්‍යායනාංශය මඟින් මෙහෙයවන අධ්‍යාපනවේදී ( නාට්‍ය හා රංගකලා) උපාධි පාඨමාලාවේ අවසන් වර්ෂ දෙක එනම් (SLQF) 5 හා (SLQF) 6 මට්ටම් සඳහා යොමු කෙරේ.

**පාඨමාලාවට ඇතුළත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :-**

(අ) සෞන්දර්ය හා සිංහල විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ හා ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහිතව සම්මාන 03 ක් සමගින් විෂයන් 06 කින් අ.පො.ස(සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.(මෙම සුදුසුකම් එක් සහතිකයකින් ඉදිරිපත් කළ හැකි විය යුතුයි)

(ආ) අ.පො.ස(උ.පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් සමත් වී තිබීම

(ඇ) මෙම පාඨමාලාවට සිසුන් තෝරා ගැනීමේදී අ.පො.ස(උ.පෙළ) සඳහා නාට්‍ය හා රංගකලාව විෂයක් ලෙස හදාරා ඇති සිසුන්ට පුමුඛතාවය ලබා දීම සලකා බලනු ලැබේ.

(ඉ) වයස අවුරුදු 18 ට නොඅඩු හා 25 ට නොවැඩි අය විය යුතුය.

### 2024 වර්ෂය් දී දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදුකිරීම

2024 වර්ෂයේදී නාට්‍ය පාසලේ අධ්‍යයන වර්ෂ තුනක සිසුන් අධ්‍යාපන කටයුතු සිදු කරන ලදී. එනම් අධ්‍යයන වර්ෂ 2021/22 ,2022 /23 වේ.

| අධ්‍යන වර්ෂය | සිසුන් සංඛ්‍යාව | දේශන පැය ගණන | ප්‍රායෝගික ක්‍රියාකාරකම් පැය ගණන |
|---|---|---|---|
| 2021/22 | සිසුන් 47 | 585 | 375 |
| 2022/23 - | සිසුන් 65 | 585 | 375 |

### 2024 වර්ෂයට නවක සිසුන් බඳවා ගැනීම

- 2024/25 අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් බඳවා ගැනීමට අදාළ විභාග නිවේදනය පුවත්පත් වල මෙන්ම ටවර් රඟහල පදනමේ වෙබ් අඩවියේ හා සමාජ මාධ්‍යයන්හි පළ කරන ලදී .

❖ 2024 පෙබරවාරි 05 දින අයදුම්පත් බාර ගැනීමේ අවසාන දිනය වශයෙන් නම් කළ අතර, මූලික සුදුසුකම් සපුරා තිබූ අයදුම්කරුවන් 120 දෙනා 2024 මාර්තු 23 දින පවත්වන ලද ලිඛිත විභාගය සඳහා කැඳවන ලදී. ප්‍රශ්නපත්‍ර දෙක සඳහා ලකුණු 40ට වැඩියෙන් ලකුණු ලබා ගත් සිසුන් ව්‍යුහගත හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත පරීක්ෂණයට කැඳවන ලද අතර, එහිදී වැඩිම ලකුණු ලබා ගත් සිසුන් 67 දෙනෙකු පාඨමාලාව සඳහා තෝරා ගන්නා ලදී.

❖ ව්‍යුහගත හා ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක, ප්‍රවීණ නාට්‍යවේදී පාලිත සිල්වා, දේවාංගනී රංගනා හා විවෘත විශ්ව විද්‍යාලය නියෝජනය කරමින් කථිකාචාර්ය ප්‍රසාද් වීරසිංහ යන මහත්ම මහත්මීන් සහභාගි වූහ.

## <u>2024 ලෝක නාට්‍ය දින සැමරුම</u>

❖ ජාත්‍යන්තර රංගකලා ආයතනය විසින් සෑම වසරකම මාර්තු මස 27 දින ප්‍රකාශයට පත් කර ඇති ලෝක නාට්‍ය දිනයට සමගාමීව එහි ශ්‍රී ලාංකික නියෝජිත වශයෙන් ටවර් හෝල් රඟහල පදනම විසින් 2024 ලෝක නාට්‍ය දිනය මෙවරද 2024 මාර්තු 27 දින මරදාන, එල්ෆින්ස්ටන් රඟහලේදී පවත්වන ලදී. මෙම උත්සව අවස්ථාවේදී සිංහල මාධ්‍ය නාට්‍ය පාසලේ අධ්‍යයන වර්ෂ 2021/22 හා 2022/23 සිසුන්ගේ පූර්ණ දායකත්වයෙන් නිෂ්පාදනය කරන ලද ළමා කෙටි නාට්‍ය හතරක් ( සිහින ලන්තෑරුම, මායා පින්සල, කීඩාරම්, Lilly's Majic World) වේදිකා ගත කරන ලදී. ඊට අමරතව මෙදින ලෝක නාට්‍ය දින පණිවුඩය සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා ත්‍රිත්වයෙන් කියවන ලදී. මෙහිදී රාජ්‍ය



නාට්‍ය උපදේශක සභාවේ සභාපති මෙන්ම කැලණිය විශ්ව විද්‍යාලයේ නාට්‍ය හා රංගකලා අංශයේ හිටපු අංශාධිපති චන්ද්‍රසිරි බෝගමුව මහතා විසින් ආරාධිත දේශනය පවත්වන ලදී.




මෙම අවස්ථාව සඳහා බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු ගරු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා, අමාත්‍යාංශ ලේකම්, අතිරේක ලේකම්වරුන් , ආරාධිත පාසල් සිසුන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.





**අධ්‍යයන වර්ෂ 2024/25 සඳහා නවක සිසුන් බඳවා ගැනීමේ උත්සවය**

- 2024/25 අධ්‍යයන වර්ෂයට නවක සිසුන් බඳවා ගැනීමේ සමාරම්භක උත්සවය 2024 ජූලි 12 දින සව්සිරිපාය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. එම අවස්ථාවට නවක සිසුන්, වත්මන් නාට්‍ය පාසලේ දරු දැරියන් හා සිසුන්ගේ දෙමාපියන්, ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් 250ට අධික පිරිසක් සහභාගී විය. ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් වූ සිසු සිසුවියන් 67 දෙනෙකු අධ්‍යයන වර්ෂ 2024/25 සඳහා නාට්‍ය හා රංගකලා පාසලට නිල වශයෙන් බඳවා ගැනීමේ ලිපි මෙහි දී ප්‍රධානය කරන ලදී.

**නවක සිසුන් දිශානතිමුඛ කිරීමේ වැඩසටහන**

- දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පාඨමාලාවට සම්බන්ධ වූ සිසු සිසුවියන්හට ටවර් හෝල් රඟහල පදනම හා පාඨමාලාව සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් ලබාදීම, බාහිර පරිසරය හා සිසු සිසුවියන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීම, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ කාර්යභාරය පිළිබඳ අවබෝධයක් ලබාදීම ඇතුළු නාට්‍ය හා රංගකලාව හා එහි නව ප්‍රවනතා පිළිබඳ දැනුවත් කිරීම යන කරුණු පදනම් කර ගනිමින් නවක සිසුන් දිශානතිමුඛ කිරීමේ කටයුතු 2024 අගෝස්තු 05 හා 06 දින දක්වා පවත්වන ලද අතර , ඉන් අනතුරුව අගෝස්තු 12 දින සිට ප්‍රථම අධ්‍යයන වර්ෂයට අදාළව ප්‍රථම අධ්‍යයන වාරයේ අධ්‍යයන කටයුතු ආරම්භ විය.

- දිශානතිමුඛ කිරීමේ වැඩසටහනේදී ප්‍රවීණ කලාකරු පාලිත සිල්වා මහතාගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත පුහුණු වැඩසටහනක් පවත්වන ලදී . එමෙන්ම විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා උපාධි පාඨමාලාවේ සම්බන්ධීකාරක ආචාර්ය අයෝමි ඉරුගල් බණ්ඩාර මහත්මිය ,ප්‍රවීන නාට්‍යවේදී චාමික හත්ලහවත්ත මහතා සහ ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී. එම්. එස්. දිසානායක යන මහත්ම මහත්මීන් විසින් ඉහත කරුණු සම්බන්ධයෙන් වන අවශ්‍ය දැනුම හා අවබෝධය සිසුන් වෙත ලබා දීමට කටයුතු කරන ලදී.

**දේශන කටයුතු හා විභාග පැවැත්වීම**

2021/22 අධ්‍යයන වර්ෂය - 2021 ජනවාරි සිට ජූලි දක්වා දේශන පවත්වන ලදී

ලිඛිත විභාග කටයුතු :-

- 2021/22 සිසුන්ගේ දෙවන අධ්‍යයන වර්ෂ ප්‍රථම වාර විභාගයේ ලිඛිත පරීක්ෂණ කටයුතු 2024 පෙබරවාරි මස 05 සිට 09 දින දක්වා පවත්වන ලදී. ලිඛිත පරීක්ෂණ කටයුතු නාරාහේන්පිට පරාක්‍රමබාහු විදුහලේදී පැවති අතර, ඒ සඳහා සිසුන් 57 දෙනෙකු පෙනී සිටින ලදී.

- දෙවන අධ්‍යයන වර්ෂ දෙවන අධ්‍යයන වාර ලිඛිත පරීක්ෂණය 2024 අගෝස්තු මස 03,05 06 දිනයන්හි පවත්වන ලදී.

<u>**ප්‍රායෝගික පරීක්ෂණ (විභාග කටයුතු)**</u> :-

- මෙම අධ්‍යයන වර්ෂයේ සිසුන්ගේ දෙවන අධ්‍යයන වර්ෂ ප්‍රථම වාර ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු 2024 පෙබරවාරි 27 දින එල්ෆින්ස්ටන් රඟහලේදීත් , දෙවන වාර ප්‍රායෝගික පරීක්ෂණය 2024 අගෝස්තු 20,21,22 ටවර් රඟහලේදීත් පවත්වන ලදී.

- ප්‍රථම වාර ප්‍රායෝගික පරීක්ෂණයට අදාළව මෙම අධ්‍යයන වර්ෂයේ සිසුන් ළමා නාට්‍ය හතරක් නිෂ්පාදනය කර එල්ෆින්ස්ටන් රඟහලේදී වේදිකා ගත කරන ලදී.

- දෙවන වාර අවසන් ප්‍රායෝගික පරීක්ෂණයට සිසුන් කණ්ඩායම් වශයෙන් බෙදී නාට්‍ය 08 ක් අධ්‍යක්ෂණය කර ටවර් රඟහලේදී වේදිකා ගත කරන ලදී. දෙවන අධ්‍යයන වර්ෂයේ ප්‍රථම වාර ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු වෙනුවෙන් චාමික හත්ලහවත්ත, ලහිරු මාඩිවිල හා ප්‍රදීප් චන්ද්‍රසිරි යන මහතුන්ගේ දායකත්වය ලබා දෙන ලදී.

- දෙවන අධ්‍යයන වර්ෂ දෙවන අධ්‍යයන වාර අවසන් ප්‍රායෝගික පරීක්ෂණයේදී සිසුන් නාට්‍ය අධ්‍යක්ෂණය, නිෂ්පාදනය, රංගාලෝක , නාට්‍ය සංගීත, වේදිකා පරිපාලනය ආදි ආනුෂංගික කලාවන් සම්බන්ධයෙන් තමන් ප්‍රගුණ කළ දැනුම පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ ඉදිරිපත් කරන ලදී. පරීක්ෂණ මණ්ඩලය වශයෙන් රාජිත දිසානායක, පී.ප්‍රදීප් චන්ද්‍රසිරි, එල්.එම්.මාඩිවිල යන මහතුන් සහභාගී වූහ.





2022/23 අධ්‍යයන වර්ෂය - 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දේශන පවත්වන ලදී .

- අධ්‍යයන වර්ෂ 2022/23 සිසුන්ගේ ප්‍රථම අධ්‍යයන වර්ෂ දෙවන අධ්‍යයන වාරයේ ලිඛිත පරීක්ෂණය 2024 ජුනි 25,26,27,28 දිනයන්හිදි පවත්වන ලදී. 2022/23 සිසුන්ගේ ප්‍රථම අධ්‍යයන වර්ෂ දෙවන වාර ප්‍රායෝගික පරීක්ෂණය 2024 ජූලි 23,24,25 දිනයන්හි පවත්වන ලදී. ප්‍රායෝගික පරීක්ෂණයේ පරීක්ෂක මණ්ඩල සාමාජිකයින් වශයෙන් පාලිත පෙරේරා, තරංගා කුමාරි හා දේවින්ද වික්‍රමසිංහ යන මහත්ම මහත්මීන් සහභාගි වූහ.

- අධ්‍යයන වර්ෂ 2024/25 සිසුන්ගේ අධ්‍යයන වර්ෂයේ ප්‍රථම අධ්‍යයන වාර දේශන කටයුතු 2024 අගෝස්තු මස සිට දෙසැම්බර් අවසානය දක්වා පවත්වන ලදී.









**අධ්‍යයන වර්ෂ 2021/22 සිසුන්ගේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය**



- ❖ 2021/22 අධ්‍යයන වර්ෂයේ සිසුන්ගේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය(10 වැනි) 2024 දෙසැම්බර් 15 දින සව්සිරිපාය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.මෙහිදි ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව අවසන් කළ සිසුන් 52 ක් ඩිප්ලෝමාලාභීන් බවට පත්විය. ( 2020/21 අධ්‍යයන වර්ෂයේ නැවත පෙනිසිටි සිසු සිසුවියන් 09 දෙනෙක්ද මීට ඇතුළත් විය)

මෙම උත්සවයේ මුඛ්‍ය දේශනය පවත්වන ලද්දේ කොළඹ විශ්ව විද්‍යාලයේ ජනමාධ්‍ය පීඨයේ මහාචාර්ය ටියුඩර් වීරසිංහ මහතා විසිනි.



- ❖ 2021/22 අධ්‍යයන වර්ෂයේ සුවිශේෂි දක්ෂතා දැක් වූ සිසු සිසුවියන් සිව් දෙනෙකු සඳහා පදක්කම් හා ශිෂ්‍යත්ව ප්‍රධානය කරන ලදී. ඔවුන්ට ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනවේදී උපාධිය හැදෑරීම සඳහා රුපියල් 50,000/- බැගින් ශිෂ්‍යත්ව මුදල් ප්‍රධානය කරන ලදී. දක්ෂතම ශිෂ්‍යාවට හිමි ටවර් පදනම අධි ශිෂ්‍යත්වය සඳහා රුපියල් 55,000/- ක මුදල් ත්‍යාගයක් පිරිනමන ලදී.



මෙම උත්සව අවස්ථාව සඳහා බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමා, එම අමාත්‍යාංශයේ ලේකම් ඒ.එම්.පී.එම්.අතපත්තු මහතා, අතිරේක ලේකම්(පාලන) එස්.ජී.පල්ලියගුරුගේ මහත්මිය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පීඨාධිපතිනි ආචාර්ය ඩී.වී.එම්. ද සිල්වා මහත්මිය, අංශාධිපති මහාචාර්ය එෆ්.එම්.නවාස්දීන් මහතා, විවෘත විශ්ව විද්‍යාලයේ නාට්‍ය හා රංගකලා උපාධි සම්බන්ධීකාරක ආචාර්ය අයෝමි ඉරුගල්බණ්ඩාර මහත්මිය, ඩිප්ලෝමාලාභීන්ගේ දෙමව්පියන්, නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්, දේශක මහත්ම මහත්මීන් , ටවර් හෝල් පදනමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් මෙන්ම නාට්‍ය පාසලේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය කණ්ඩායම ඇතුලු 200 ක පමණ පිරිසක් සහභාගී වූහ.





## දෙමළ මාධ්‍ය නාට්‍ය හා රංගකලා පාසල

1. දෙමළ නාට්‍ය පාසල
2. දෙමළ සංස්කෘතික වැඩසටහන
3. දෙමළ නාට්‍ය ප්‍රවර්ධනය

### දෙමළ නාට්‍ය පාසල :-

<u>යාපනය නාට්‍ය හා රංගකලා දෙමළ මාධ්‍ය පාසලට 2024/2025 වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම</u>

ඊට අදාල සම්මුඛපරීක්ෂණ පවත්වා ඒ අනුව සදුසුකම් සම්පූර්ණකර තිබූ සිසුන් 45 දෙනෙකු බඳවා ගන්නා ලදි.එම සිසුන් බඳවා ගැනීමේ උත්සවය 2024.09.03 දින වන්කාලෙන සංස්කෘතික මධ්‍යස්ථානයේදි සිදු කරන ලදි.

මෙම අවස්ථාවට මහාචාර්ය අරුණාචලම් සම්මුඛදාස් මහතා,උතුරු පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්,යාපනයේ විවෘත විශ්වවිද්‍යාලයේ කේ.කන්දවේල් මහතා,ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් හා දෙමළ නාට්‍ය අංශයේ සහකාර අධ්‍යක්ෂ ආදීන් සහභාගී විය.

<u>නවක සිසුන් දිශාභිමුඛගත කිරීම.</u>

2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගනුලැබූ සිසුන් සඳහා විෂය නිර්දේශයන් ලබා දීම ටවර් හෝල් රඟහල පදනමේ කාර්යභාරය හඳුන්වා දීම,විවෘත විශ්වවිද්‍යාලයේ භූමිකාව හඳුන්වා දීම මෙන්ම ඔවුන්ගේ දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් දිශාභිමුඛගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක විය.





<u>දෙමළ මාධ්‍ය නාට්‍ය පාසලේ ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම විසින් නාට්‍යයක් නිෂ්පාදනය කිරීම</u>

2022/2023 අධ්‍යයන වර්ෂයේ සිසු සිසුවියන් අධ්‍යයන කටයුතු අවසන් වීමෙන් අනතුරුව තම හැකියාවන් ප්‍රදර්ශණය කිරීම සඳහා නාට්‍යක් නිෂ්පාදනය කරන ලදි.**"කිංග්ලියර්"** නාට්‍ය දෙමළ භාෂාවෙන් පරිවර්ථනය කරන ලද ලංකාවේ බිහිවූ පළමු නාට්‍ය වේ.මෙම නාට්‍ය පූර්ණ නිෂ්පාදන අයිතිය ටවර් හෝල් රඟහල පදනම සතු වේ.එහි  මංගල දර්ශනය 2024.07.23 දින සංදිලිපායි සංස්කෘතික මධ්‍යස්ථානයේදී ප්‍රදර්ශනය කරන ලදි. එහි පළමු දර්ශනය නැරඹීම සඳහා එදින 300 කට අධික ප්‍රදේශවාසීන් පිරිසක් සහභාගී විය.





යාපනයේ දෙමළ මාධ්‍ය නාට්‍ය හා රංගකලා පාසලේ ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම සඳහා නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා ප්‍රධානය කිරීම.

2024.12.28 දින අධ්‍යන වර්ෂ 2022/2023 වර්ෂයේ නියමිත පරිදි අධ්‍යන කටයුතු අවසන් කල සිසු සිසුවියන් 44 දෙනෙකු සඳහා මෙහිදි නාට්‍ය හා රංගකලාව පිළිබඳ උසස් ඩිප්ලෝමාව ප්‍රධානය කරන ලදි.මෙම උත්සවය සඳහා ගරු බුද්ධශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ආරාධනයෙන් ධීවර ජලජ හා සාගර සම්පත් අමාත්‍ය රාමලිංගම් චන්ද්‍රෙස්කරම් මැතිතුමා හා උතුරු පාලාත් ආණ්ඩුකාර නාගලිංගම් වේදනායගන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා උතුරු පළාත් ප්‍රධාන ලේකම්තුමා,උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්,ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුලු රජයේ නිලධාරීන්,පාළාත් සභා නිළධාරීන් හා ඩිප්ලෝමා ලාභීන්ගේ දෙමාපියන් ඇතුලු විශාල පිරිසක් සහභාගී විය.



අධ්‍යාපන ශිෂත්ව 05 ක් ප්‍රදානය කිරීම.

2022/2023 අධ්‍යන වර්ෂයේ සුවිශේෂි දක්ෂතා දැක්වූ සිසුන් 04 දෙනෙකු සඳහා පදක්කම් හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන වේදී උපාධිය හැදෑරීම සඳහා රුපියල් පනස්දහස බැගින් මුදල් ත්‍යාග ප්‍රධානය කරන ලදි.

| | | |
|---|---|---|
| 01. ර්.ජෙන්සනා සිසුවිය | - | මහාචාර්ය එස්.විද්‍යානන්තන් අනුස්මරණ පදක්කම. |
| 02. එන්.නිලක්ශනා සිසුවිය | - | නාට්‍යමයිල් කලාභූෂණ නාගමණිපොඩි අන්නාවියාර් අනුස්මරණ පදක්කම. |
| 03. එස්.සංගීතා සිසුවිය | - | මරියසේවියර් අඩිගලාර් අනුස්මරණ පදක්කම. |





එසේම අධ්‍යන දෙවර්ෂයේ සියලු විෂයන් සඳහා වැඩිම ලකුණු ලබා ගනිමින් නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ වැදගත්ම සම්මානය වන පදනම පදක්කම හා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනවේදී උපාධිය හැදෑරීම සඳහා රුපියල් 55,000.00 ක අධි ශිෂ්‍යත්වය ඩයනා ජේකොඩි සිසුවිය විසින් හිමිකරගන්නා ලදි.

## දෙමළ සංස්කෘතික වැඩසටහන :-

<u>තෛයිපොංගල් උත්සවය පැවැත්වීම</u>.



නව වසරේ වැඩකටයුතු ආරම්භ කිරීමට ප්‍රථම අශීර්වාද ලබා ගැනීමේ අරමුණින් දෙමළ නාට්‍ය පාසලේ සිසු සිසුවියන් විසින් ජනවාරි මස 14 වන දින තෛයිපොංගල් උත්සවය සමරන ලදි.

<u>රාවණේෂන් කූත්තු නාට්‍ය හා කාත්තවරායන් කූත්තු යන නාට්‍ය දෙක වේදිකා ගත කරීම.</u>



නල්ලූර් කෝවිලේ වාර්ෂික උත්සවය සැමරීම පිනිස ටවර් නාට්‍ය පාසල විසින් නිෂ්පාදිත රාවණේෂන් නාට්‍ය හා කාත්තවරායන් කූත්තු යන නාට්‍ය දෙක 2024 අගෝස්තු 31 දින වේදිකා ගත කරන ලදි.

**<u>සරස්වතී පූජාව පැවැත්වීම.</u>**

දෙමළ මාධ්‍ය නාට්‍ය පාසලේ සිසු සිසුවියන්ගේ හා ප්‍රදේශවාසීන්ගේ සහභාගිත්වයෙන් 2024 ඔක්තෝබර් 11 දින සරස්වතී පූජාව වංකාලෙන හා සංදිලිපායි සංස්කෘතික මධ්‍යස්ථානයේදී පවත්වන ලදි.

## දෙමළ නාට්‍ය ප්‍රවර්ධනය :-

<u>යාපනය ප්‍රදේශයේ පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම</u>



දෙමළ මාධ්‍ය නාට්‍ය හා රංගකලා පාසලට සිසුන් යොමු කරවා ගැනීම හා නාට්‍ය හා රංගකලාව විෂය ඉගැන්වීමේදී ගුරුවරුන් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා විසඳුම් ලබා දීම අරමුණු කර ගනිමින් 2024 ඔක්තෝම්බර් 29 හා 30 යන දින වල යාපනයේ හින්දු විද්‍යාලයේදී මෙම වැඩමුළුව පවත්වන ලදී.උතුරු පළාතේ සියලු දිස්ත්‍රිකවල මෙම වැඩමුළු මාලාව උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබේ.

## <u>හාත්බණ්ඩ විභාගය පැවැත්වීම</u>

2024 වර්ෂය සඳහා වන හාත්බණ්ඩ විභාග සඳහා අයදුම්පත් කැඳවීම ජුලි මාසයේදි සිදු කරන ලද අතර 150 ට අධික සිසු සිසුවියන් සංඛ්‍යාවක් මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලදි.

හාත්බණ්ඩ විභාගයට අදාල ලිඛිත පරීක්ෂණ දෙසැම්බර් මස 28,29 දෙදින තුල සිදුකරනලද අතර ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු ද අවසන් කරන ලදි.





## <u>නර්ථනය හා සංගීතය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය නිර්දේශ සකස් කිරීම.</u>

දෙමළ නාට්‍ය ප්‍රවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරන ලද ඉහත ඩිප්ලෝමා පාඨමාලාවන්ට අදාල විෂය නිර්දේෂය සැකසීමේ කටයුතු 2024 වර්ෂයේ ජනවාරි මස සිට ජුලි මස දක්වා ක්‍රියාත්මක කර අවසන් කරන ලදි.එලෙස අවසන් කල සංගීතය හා නර්ථන පාඨමාලාවන්ට අදාල විෂය නිර්දේශ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අනුමැතියට යොමු කරන ලදි.

## අභියෝග

- ❖ ටවර් හෝල් රඟහල පදනම සතු ටවර් හා එල්ෆින්ස්ටන් රඟහල වසර 100 ට වඩා පැරණි බැවින් එවා නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වීම.

- ❖ වසර 40 පුරා ටවර්, එල්ෆින්ස්ටන් හා රුක්මණී දේවී රඟහල් සඳහා නොමිලේ විදුලිය ලබා දීම 2023 වසරේ නතර කිරීම නිසා විදුලි බලය වෙනුවෙන් පමණක් 2024 වසරේ රු. මි. 20.16 මුදලක් වැය කිරීමට සිදු විම.

- ❖ සේවක වැටුපෙන් අඩක් භාණ්ඩාගාරය විසින් කපාහැරීම නිසා 2024 වසරේ පමණක් සේවක වැටුප් වෙනුවෙන් රු.මි 14.05 දැරීමට සිදු වීම.

- ❖ පවතින ආර්ථික ගැටළු මත නිෂ්පාදකයින් කලා කටයුතු සඳහා සිදුකරන ආයෝජනය අඩු වීම.

## ඉදිරි ඉලක්ක

- ❖ වේදිකා නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලාවන්හි නියැලෙන්නන් ඇගයීම හා ඔවුන්ගේ සුභසාධන කටයුතු ඉහළ නැංවීම.
- ❖ නාඩගම්,නූර්ති,ටීටර් යුගයේ නිර්මාණ රසාස්වාදය වෙනුවෙන් අනාගත පරපුරට දායාද කිරීම.
- ❖ ගුණාත්මක නාට්‍ය හා ප්‍රාසාංගික කලා නිර්මාණ බිහිකිරීමට නිර්මාණවේදීන් පෙළඹවීම.
- ❖ දේශීය නාට්‍ය හා ප්‍රාසාංගික කලාවන් ජාත්‍යාන්තරයට රැගෙනයාම හා ජාත්‍යාන්තර ප්‍රවණතා දේශීය නාට්‍ය හා ප්‍රාසාංගික කලාවන්ට හඳුන්වා දීම,පුළුල් කිරීම.
- ❖ ටවර් හෝල් රඟහල පදනම සතු රංගශාලා හා ශබ්දාගාරය සංවර්ධනය කර දෙස් විදෙස් ජනතාව අතර ප්‍රචලිත කිරීම.
- ❖ නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලාවන්හී ගුණාත්මක සංස්කෘතියක් බිහිකිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- ❖ ඉහත සියළුම කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කෙරෙන මුදල් උපයා ගැනීම සඳහා උභයාන්තර උත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ආචාර්ය ඩී.එම්.එස්.දිසානායක
අධ්‍යක්ෂ ජනරාල්
ටවර් හෝල් රඟහල පදනම

## පරිච්ඡේදය 03 වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| **එකතු කළා:** | | | |
| රජයෙන් ලද ප්‍රදාන - පුනරාවර්තන වියදම් | | 43,900,000 | 59,090,000 |
| රජයෙන් ලද ප්‍රදාන - ප්‍රාග්ධන වියදම් | **19** | 2,4492,000 | - |
| මෙහෙයුම් ආදායම | **1** | 53,938,663 | 44,101,265 |
| පොලී සහ වෙනත් ආදායම් | **2** | 26,749,089 | 44,782,335 |
| වැඩසටහන් ආදායම | **3** | 17,161,545 | 16,074,475 |
| | | 166,241,297 | 164,048,075 |
| වියදම් | | | |
| **අඩු කළා:** | | | |
| පරිපාලන සහ ආයතනික වියදම් | **4** | 208,224,998 | 197,934,917 |
| සුබසාධන වියදම් | **5** | 13,627,880 | 10,885,097 |
| වැඩසටහන් වියදම් | **6** | 17,556,252 | 18,671,331 |
| මූල්‍ය සහ වෙනත් වියදම් | **7** | 74,391 | 80,026 |
| | | 239,483,521 | 227,571,371 |
| ආදායම ඉක්මවූ වියදම | | **(73,242,224)** | **(63,523,296)** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | |
| ක්‍රමක්ෂය | | - | **48,679,055** |
| ආදායම ඉක්මවූ වියදම | | **(73,242,224)** | **(14,844,240)** |

3.2 මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශනය

| | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **වත්කම්**<br>**ජංගම වත්කම්** | | | |
| අතේ ඇති මුදල් සහ බැංකු ශේෂය | **8** | 21,231,867 | 11,437,498 |
| තොග | **9** | 3,797,874 | 3,795,670 |
| තැන්පතු | **10** | 8,000 | 158,000 |
| පෙරගෙවුම් | **10** | 1,800,797 | 967,408 |
| වසරක් ඇතුළත ලැබිය හැකි ආපදා ණය | **10** | 2,428,065 | 2,694,240 |
| අත්තිකාරම් | **10** | 1,371,686 | 2,874,931 |
| ණය ගැතියන් | **11** | 128,517,461 | 11,286,042 |
| ලැබිය යුතු වෙනත් දෑ | **11** | 614,576 | 345,152 |
| කෙටිනාලීන ආයෝජන - THT, ශිෂ්‍යත්ව අරමුදල සහ TRT | **12** | 148,330,000 | 128,200,000 |
| කෙටිනාලීන ආයෝජන - PWF | **12** | 76,800,000 | 72,600,000 |
| **මුළු ජංගම වත්කම්** | | **384,900,326** | **234,358,942** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | **14** | 1,301,497,917 | 1,374,828,640 |
| දීර්ඝ කාලීන ආයෝජනය - THT | **13** | 20,000,000 | 20,000,000 |
| දීර්ඝ කාලීන ආයෝජනය - PWF | **13** | 4,000,000 | 8,200,000 |
| ලැබිය යුතු ආපදා ණය (වසරකට පසු) | **10** | 5,780,500 | 7,390,575 |
| **ජංගම නොවන මුළු වත්කම්** | | **1,331,278,417** | **1,410,419,215** |
| **මුළු වත්කම්** | | **1,716,178,743** | **1,644,778,157** |
| **බැරකම්**<br>**ජංගම බැරකම්** | | | |
| ණයහිමියන් සහ උපචිත වියදම් | **15** | 10,559,931 | 15,787,503 |
| අත්තිකාරම් වශයෙන් ලැබුණු මුදල් | **16** | 7,567,050 | 7,703,670 |
| ආපසු ගෙවීමට ඇති තැන්පතු | **17** | 2,473,300 | 2,594,400 |

| | | | |
|---|---|---|---|
| **මුළු ජංගම බැරකම්** | | **20,640,281** | **26,085,573** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් | | 700,000 | - |
| පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම් | | 30,303,417 | 24,184,697 |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **31,003,417** | **24,184,697** |
| **සම්පූර්ණ බැරකම්** | | **51,643,698** | **50,270,270** |
| **ශුද්ධ වත්කම්** | | **1,664,535,045** | **1,594,507,887** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධ</u>** | | | |
| සමුච්චිත අරමුදල | **18** | 171,309,333 | (4,423,359) |
| **සංචිත** | | | |
| රජයේ ප්‍රදානය | | - | 1,000,000 |
| රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය | | 195,336,663 | 219,642,366 |
| ජනාධිපති සුබසාධන අරමුදල | | 80,800,000 | 80,800,000 |
| මුදල් පරිත්‍යාග | | - | 18,577,319 |
| පරිත්‍යාග | | - | 58,890,541 |
| වාහන පරිත්‍යාග | | 1,987,329 | 2,275,000 |
| රුක්මණී දේවි අරමුදල | | - | 21,176 |
| වත්කම් ප්‍රත්‍යාගණනය | | 1,214,706,892 | 1,216,450,453 |
| නාට්‍ය සහ රංගකලා ශිෂ්‍යත්ව අරමුදල | | 394,828 | 394,828 |
| ශිෂ්‍යත්ව අරමුදල | | - | 602,665 |
| ටවර් වෘත්තියාභිමුඛ සංසදය | | - | 276,900 |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධ** | | **1,664,535,045** | **1,594,507,887** |

The notes appearing on pages 12 to 26 form an integral part of the financial statements.

The Members of the Tower Hall Theatre Foundation are responsible for the preparation and presentation of these financial statements.

For and on behalf of the Members of the Board,

| | | | |
|---|---|---|---|
| ………………………… | ………………………… | ………………………… | ………………………… |
| E I A Samarakoon | Dr. D M S Dissanayake | Member of the | Member of the |
| Assistant Director (Finance) | Director General | Board of Trustee | Board of Trustee |

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| ආදායම ඉක්මවූ වියදමේ ප්‍රමාණය | (73,242,224) | (63,523,296) |
| එකතු කළා: පෙර වසර සඳහා ගැලපීම | 145,300,613 | (65,526,544) |
| **ගැලපුම් කළ ආදායම ඉක්මවූ වියදමේ ප්‍රමාණය** | **72,058,389** | **(129,049,840)** |
| <u>ගැලපීම</u> | | |
| බැහැර කිරීමේ වත්කම්වල ලාභය/වත්කම් නැවත තක්සේරු කිරීම | (1,768,611) | - |
| ක්ෂය වීම | 88,339,960 | 96,533,261 |
| විගණන ගාස්තු | 700,000 | - |
| පොලී ආදායම | (26,436,368) | (43,833,685) |
| පරිත්‍යාග සහ ප්‍රාග්ධන ආධාර ලෙස ලද වාහන | (287,671) | (700,000) |
| පාරිතෝෂිතය | 6,935,090 | 1,961,380 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මුදල් ප්‍රවාහ ක්‍රියාත්මක කිරීම** | **139,540,789** | **(75,088,884)** |
| තොග (වැඩිවීම) /අඩුවීම | (2,204) | (1,088,744) |
| ණය ගැතියන් සහ අනෙකුත් ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | (117,500,842) | (6,693,880) |
| තැන්පතු, පෙරගෙවුම් සහ අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම | (683,389) | (95,252) |
| ණයහිමියන්ගේ සහ උපචිත වියදම්වල වැඩි වීම/(අඩුවීම). | (5,187,573) | 1,458,998 |
| අත්තිකාරම් වශයෙන් ලැබුණු මුදල වැඩි කිරීම/(අඩුවීම). | (136,620) | 6,072,655 |
| අත්තිකාරම් වශයෙන් ගෙවූ මුදල වැඩි වීම/(අඩුවීම). | 1,503,245 | 4,570,260 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු වැඩි වීම/(අඩු වීම). | (121,100) | 589,100 |
| ලැබිය යුතු ආපදා ණය වැඩි වීම /(අඩු වීම). | 266,176 | 156,968 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලින් පසු මුදල් ප්‍රවාහ ක්‍රියාත්මක කිරීම** | **17,678,483** | **(70,118,779)** |
| ගෙවන ලද පාරිතෝෂිත | (816,370) | (973,483) |
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 පදනමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් පදනමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලැබේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ උචිතත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ

4

නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත ආයතනයේ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ආ) හා (ඊ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඉ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ බලතල. කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ සම්පත් සකසුරුවම් ලෙස. කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 **වෙනත් කරුණු**

(අ) ටවර්හෝල් රඟහල පදනමේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමේදී ගීත. නෘත්‍ය. නැටුම් හා සංගීත නිෂ්පාදනය කිරීමේ හා ඒ පිළිබඳව පර්යේෂණ කිරීම හා යොදාගැනීම කලයුතු යුතු වුවත් 2025 මැයි 30 දින දක්වාම කිසිදු පර්යේෂණයක් සිදු කර නොතිබූ අතර ඒ සඳහා වාර්ෂික අයවැය ලේඛණය මගින් ප්‍රතිපාදනද සලසා ගෙන නොතිබුණි.

(ආ) ටවර් හෝල් රඟහල පදනමට අයත් සව්සිරිපාය ගොඩනැගිල්ලේ, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පවත්වාගෙන යනු ලබන කාර්යාලය, 2024 ජුලි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පදනමේ කාර්යාල පරිශ්‍රයෙන් ඉවත් විය යුතු අතර පදනම වෙත ගෙවිය යුතු රු.මිලියන 145 ක මුදල වහාම ගෙවීම සඳහා කටයුතු කල යුතු බවට නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් ලබා දී තිබුණි. එසේ වුවද විගණිත දිනය වූ 2025 ජුනි 30 දින දක්වාත් පදනමේ කාර්යාල පරිශ්‍රයෙන් අධිකාරිය ඉවත්ව නොතිබුණු අතර රු. මිලියන 120 ක් වූ ඉතිරි මුදල ද අය වී නොතිබුණු නමුත්, අදාල රේඛීය අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කරවා ගැනීම සම්බන්ධයෙන් මැදිහත් වීමක් සිදුකර නොතිබුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති ( වැ.බ)

# පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

04.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| *ගිණුම් අංශය* | | | |
| වාර්ෂික ගිණුම් වාර්ථා සකස් කිරීම 2024 | ✓ | | |
| 2024 වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම | ✓ | | |
| මාසික වැටුප් සැකසීම 2024 | ✓ | | |
| 2024 මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම | ✓ | | |
| බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීම | ✓ | | |
| විගණන විමසුම් සඳහා පිලිතුරු යැවීම | ✓ | | |
| ගිණුම් පියවීම 2024 | ✓ | | |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂනය සිදුකිරීම | ✓ | | |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම 2024 | ✓ | | |
| 2024 අවසන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම | ✓ | | |
| *පාලන අංශය* | | | |
| ආයතනය තුල, කඩදාසි භාවිතය අවම කිරීම හා ලිපි ද්‍රව්‍ය භාවිතය කලමනාකාරණය කිරීම, ඵලදායි නිවැරදි වැඩ පරිසරයක් පවත්වාගෙන යාම | | ✓ | |
| කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළු හා දැනුම බෙදාගැනීම හා සාමාන්‍ය පරිපාලනය හා ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම | | | ✓ |
| 2024 ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | ✓ | | |
| නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම | ✓ | | |
| වැටුප් වර්ධක,ණය හා නිවාඩු අනුමත කිරීම | ✓ | | |
| කාර්ය සාධන වාර්ථා සකස් කිරීම | ✓ | | |
| වාහන කළමනාකරණය,රක්ෂණය හා ආදායම් බලපත්‍ර, සේවා කිරීම හා නඩත්තු කිරීම | ✓ | | |
| *වැඩසටහන් අංශය* | | | |
| වැඩසටහන් සංවිධානය කිරීම | | ✓ | |

| | | | |
|---|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මට අදාළ වැඩසටහන් පැවැත්වීම | | ✓ | |
| **අධ්‍යාපන අංශය** | | | |
| පාඨමාලා සඳහා නව බඳවා ගැනීම | ✓ | | |
| පාඨමාලා පැවැත්වීම | ✓ | | |
| ඇගයීම් කිරීම | ✓ | | |
| සහතික ප්‍රදානය කිරීම | ✓ | | |

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 2024

| කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| ටවර් රඟහලේ ඔර්ලෝසු කුළුණ ඉහල කොටස නැවත සකස් කිරිම. | ✓ | | |
| ටවර් රඟහල පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය ශබ්ද උපාංග එක් කිරීම | ✓ | | |
| ටවර් රඟහලේ රංගාලෝක පද්ධතිය වැඩිදියුණු කිරීම | ✓ | | |
| ටවර් රඟහලේ මධ්‍යම වායුසමීකරණය වැඩිදියුණු කිරීම | ✓ | | |
| ටවර් රඟහලේ පුටු අලුත්වැඩියා කිරීම | ✓ | | |
| එල්ෆින්ස්ටන් රඟහලේ මියුසික් පිට් කොටස අලුතින් සැකසීම | ✓ | | |
| එල්ෆින්ස්ටන් රඟහලේ විදුලි ජනක යන්ත්‍රයට ඉහළින් වහලක් සකස් කිරීම, | ✓ | | |
| එල්ෆින්ස්ටන් රඟහලේ වායුසමීකරණ යන්ත්‍ර කාමරය සකස් කිරීම | ✓ | | |
| එල්ෆින්ස්ටන් රඟහලේ CCTV කැමරා පද්ධතියට අමතර කැමරා එක්කිරීම | ✓ | | |
| රුක්මණී දේවි රඟහල වැසි ජලයෙන් ආරක්ෂා කර ගැනීම සඳහා කාර්යාල ප්‍රදේශයේ වහලය දික්කර අළුතින් කොටසක් එක්කර ජලයෙන් යටවන මාර්ගය පිළිසකර කිරීම. ආදායම් උත්පාදක මාර්ගයක් ලෙස නව පන්ති කාමර ශාලාවක් සකස් කර ජලයෙන් යටවන මාර්ගය පිළිසකර කිරිම. | ✓ | | |

| | | | |
|---|---|---|---|
| රුක්මණී දේවි රඟහලට අවශ්‍ය පුටු මිලදී ගැනීම | ✓ | | |
| ටවර් ශබ්දාගාරය පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය නව ශබ්ද උපකරණ එක් කිරීම | ✓ | | |
| 64-7233 ජීප් රථයේ ප්‍රාග්ධන ස්වභාවයේ වාහන අලුත්වැඩියාවන් සහ වැඩිදියුණු කිරීම | ✓ | | |
| GZ 9749 කැබ් රථයේ ප්‍රාග්ධන ස්වභාවයේ වාහන අලුත්වැඩියාවන් සහ වැඩිදියුණු කිරීම. | ✓ | | |
| PE 1096 ජීප් රථයේ ප්‍රාග්ධන ස්වභාවයේ වාහන අලුත්වැඩියාවන් සහ වැඩිදියුණු කිරීම. | ✓ | | |
| දෙමළ මාධ්‍ය නාට්‍ය පාසැල පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය අංගරචන ද්‍රව්‍ය හා භාණ්ඩ මිළදී ගැනීම. | ✓ | | |
| දෙමළ මාධ්‍ය නාට්‍ය පාසැල පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය ශබ්ද උපකරණ කට්ටලයක් මිළදී ගැනීම | ✓ | | |
| දෙමළ මාධ්‍ය නාට්‍ය පාසැල පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය සංගීත භාණ්ඩ මිළදී ගැනීම | | | ✓ |
| දෙමළ මාධ්‍ය නාට්‍ය පාසල සඳහා පරිගණක 4 ක් මිළදි ගැනීම | ✓ | | |
| **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව (ආයතනික ආදායම්න් ) කරන ලද වැඩසටහන්හි කාර්ය සාධන දර්ශක** | | | |
| නාට්‍ය හා රංගකලා පාසල පැවැත්වීම - සිංහල හා දෙමළ මාධ්‍ය උසස් ඩිප්ලෝමා පාඨමාලාව | ✓ | | |
| කෙටිකාලීන (NVQ -4) පාඨමාලා පවත්වාගෙන යාම - සිංහල සහ දෙමළ | | | ✓ |
| හාත්බණ්ඩ නැටුම්/ සංගීත විභාගය පැවැත්වීම | | ✓ | |
| ලෝක නාට්‍ය දින සැමරුම් උත්සවය | ✓ | | |
| අන්තර් ජාතික ප්‍රාසාංගික කලා හුවමාරු වැඩසටහන් හා විදෙස් නාට්‍ය උළෙල නියෝජනය කිරීම | | ✓ | |
| කලාකරු ජීවනාධාර දීමනා ලබාදීම | ✓ | | |
| ටවර් හා ප්‍රාසාංගික ශිල්පීන් සඳහා මරණාධාර ලබාදීම | ✓ | | |
| කලාකරුවන් සඳහා වෛද්‍යාධාර ලබාදීම | ✓ | | |
| වියපත් කලා ශිල්පීන් සඳහා වෛද්‍ය සායන පැවැත්වීම | | | ✓ |
| අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය "ටවර් නාට්‍ය උළෙල- 2024" | ✓ | | |
| කලාකරුවන් සඳහා අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය | ✓ | | |

| | | | |
|---|---|---|---|
| ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංග පැවැත්වීම | | | ✓ |
| ටවර් රංග යාත්‍රා රසවින්දනාත්මක අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම | ✓ | | |
| යූ ටියුබ් නාලිකාව හා ෆේස්බුක් ගිණුම යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම | ✓ | | |
| සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය - 2024 | | | ✓ |
| බොදු බැති ගී ප්‍රසංග පැවැත්වීම | ✓ | | |
| පොසොන් පොහොය වෙනුවෙන් බොදු බැති ගී ප්‍රසංගයක් පැවැත්වීම | ✓ | | |

## පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5:1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 4.ගුණාත්මක අධ්‍යාපනයක් | 4.7 ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවන් ලබාගෙන සිටීම. එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායක වීම.<br><br>4.4 සුදුසු රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම. | *නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම<br>* නර්ථනය,සංගීතය පිළිබද (සිංහල මාධ්‍ය) ඩිප්ලෝමා පාඨමාලාවට ආදළ විෂය නිර්දේශ සකස් කිරීම<br>* වෘත්තීය (NVQ -4) පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කල සිසුන් ප්‍රමාණය<br>* ලෝක නාට්‍ය දිනය සැමරුම් උත්සවය සඳහා සහභාගීවූ සංඛ්‍යාව<br>* "2024 අපේක්ෂාවේ වේදිකා මංගල්‍ය" ටවර් නාට්‍ය උළෙල වෙනුවෙන් පැවැත්වූ නාට්‍ය සංඛ්‍යාව | | | ✓ |
| 1.සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1.2ජාතික මට්ටමේ අර්ථ නිරූපණවලට අනුකූල වන පරිදි සියලුම ආකාරයේ දරිද්‍රතාවන්ගෙන් පෙළෙන සියලු වයස් කාණ්ඩවලට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩුකිරීම. | * මාසික ජීවනාධාර දීමනා ලබාදුන් කලාශිල්පීන් සංඛ්‍යාව<br>* වෛද්‍යාධාර ලබාදුන් කලා ශිල්පීන් සංඛ්‍යාව | | | ✓ |

## 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

**ජයග්‍රහණ**

✓ “2024 අපේක්ෂාවේ වේදිකා මංගල්‍ය” - ටවර් නාට්‍ය උළෙල පැවැත්වීම තුලින් නවක නාට්‍ය කරුවන්ගේ දිගු,කෙටි හා ළමා වේදිකා නාට්‍ය 44 ක් කොළඹ ප්‍රධානතම රංගශාලාවන් වන ටවර් රඟහල හා එල්ෆින්ස්ටන් රංගශාලාවන්හිදී ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබාදීම, රංගශාලා සඳහා ප්‍රේක්ෂකයින් ආකර්ශනය කරගැනීම හා නාට්‍යකරුවන්ට ආදායමක් ලබාගත හැකි අවස්ථාවක් උදාකර දීම හා ප්‍රදර්ශනය කල නාට්‍ය 44 පිළිබඳව පුවත්පත් දැන්වීම් හා රූපවාහිනියේ ප්‍රවෘත්ති හරහා ප්‍රචාරණයක් ලබා දීම තුලින් එම නාට්‍ය ජනතාව අතර ජනප්‍රිය කිරීමට හැකිවිය. තවද නාට්‍ය කරුවන් දිරිමත් කිරීමට හැකියාව ලද හෙයින් නාට්‍ය කලාව ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වීමට හැකිවිය.

✓ යාපනයේ ක්‍රියාත්මක දෙමළ මාධ්‍ය නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ 2024 වර්ෂය සඳහා සුදුසුකම් ලැබූ තරුණ තරුණියන් 45 ක් බඳවා ගන්නා ලදී. ඒ තුලින් උතුරේ තරුණ තරුණියන්ට නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමාව හැදෑරීමට අවස්ථාව ලබාදීමට හැකිවිය.

✓ ටවර් හෝල් රඟහල පදනමට අදාළ ජනාධිපති සුභ සාධක අරමුදලේ ඉපයීම් වලින් කලාශිල්පීන් 82 දෙනෙකු හා ටවර් හෝල් රඟහල පදනමේ ඉපයීම් වලින් කලාශිල්පීන් 40 දෙනෙකු සඳහා රු.10,000/- බැගින් මාසික ජීවනාධාර දීමනාවක් සහ වෛද්‍යාධාර දීමනා ලබාදීම තුලින් වියපත් කලාකරුවන්ගේ සෞඛ්‍ය සුභසාධනය ඉහළ නැංවීමට හැකිවීම.

✓ සිංහල මාධ්‍ය ඩිප්ලෝමාධාරීන් 52 ක් හා දෙමළ මාධ්‍ය ඩිප්ලෝමාධාරීන් 44 ඇතුළු සිසු සිසුවියන් 96 දෙනෙකු සඳහා නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීම තුලින් නාට්‍ය හා රංගකලා ක්ෂේත්‍රයේ නියැලීමට හා උසස් අධ්‍යාපන අවස්ථා හිමිකර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම ලභාකරදීමට හැකි විය.

✓ නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ තෝරාගත් විෂය ක්ෂේත්‍ර 05 කින් වැඩිම දක්ෂතා පිළිබිඹු කල සිංහල මාධ්‍ය සිසු සිසුවියන් 05 දෙනෙකුට හා දෙමළ මාධ්‍ය සිසු සිසුවියන් 05 දෙනෙකු සඳහා එක් අයෙකුට රු 50,000/- වටිනා ශිෂ්‍යත්ව 10 ක් ප්‍රදානය කරන ලදී.

✓ ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ සිංහල හා දෙමළ මාධ්‍ය නාට්‍ය පාසල් දෙකෙන්ම ඩිප්ලෝමාධාරීන් 96 දෙනෙකු ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා ඇතුලත් කරන ලදී. ඉන් සිසු සිසුවියන් 52 (සිංහල මාධ්‍ය) නාවල ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයට තවත් (දෙමළ මාධ්‍ය) සිසු සිසුවියන් 44 දෙනෙක් යාපනය ශාඛාවට ඇතුලත් කරන ලදි.

✓ දිවයිනේ ප්‍රථම වතාවට ආරම්භ කරන ලද රංගනය පිලිබඳ වෘත්තීය පාඨමාලාව (NVQ - 4 ) දෙවන කණ්ඩායම සඳහා 2024 වර්ෂයේ සිසු සිසුවියන් 25 ක් බඳවා ගන්නා ලදී.

✓ වැඩි ඉල්ලුමක් ඇති නර්ථනය,සංගීතය පිලිබඳ (සිංහල මාධ්‍ය) ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීමට අදාළ විෂය නිර්දේශ සකස් කර, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය වෙත යොමු කරන ලදී.

✓ යුනෙස්කෝ ආයතනය විසින් පිහිටුවා ඇති ජාත්‍යන්තර රංගකලා ආයතනයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත ලෙස කටයුතු කරන ටවර් හෝල් රඟහල පදනම සෑම වර්ෂයකම මාර්තු මස 27 දින ලෝක නාට්‍ය දිනය වෙනුවෙන් සැමරුම් උත්සවක් පවත්වනු ලබයි. 2024 වර්ෂයේ මාර්තු 27 දින මරදාන එල්ෆින්ස්ටන් රංගශාලාවේදී කොළඹ නරගයේ පිහිටි සිංහල,දෙමළ හා මුස්ලිම් පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් 800 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් සැමරුම් උත්සවයක් පවත්වන ලදී.

<u>අභියෝග</u>

✓ යාපනය ටවර් නාට්‍ය පාසලේ දෙමළ මාධ්‍යයෙන් ක්‍රියාත්මක කෙරෙන නාට්‍ය හා රංගකලාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා උතුරු නැගෙනහිර තරුණ තරුණියන් ආකර්ෂණය කර ගැනීම.

✓ සංගීතය, නර්ථනය උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා විෂය නිර්දේශ සකස් කර ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයට බාර දුන්නද ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ගතවන කාලය වැඩිවීම.

✓ නිර්මාණකරුවන් විසින් අලුතින් හඳුන්වාදෙන වේදිකා නාට්‍ය නැරඹීම සඳහා ප්‍රමාණවත් ප්‍රේක්ෂකයන් ප්‍රමාණයක් නොමැති වීම.

✓ ටවර්,එල්ෆින්ස්ටන්,රුක්මණීදේවි රංගශාලා සඳහා මාසිකව දළ වශයෙන් රුපියල් ලක්ෂ 20 ක පමණ මුදලක් විදුලි බිල්පත් ලෙස ගෙවීමට සිදුවීම.

✓ කොළඹ නගරයේ වැඩිපහසුකම් හා අවම මිළ ගණන් යටතේ රංගශාලා පවත්වාගෙන යාම සඳහා දැරිය යුතු පිරිවැය අධික වීම හා වැඩි පහසුකම් සහිත රංගශාලා බිහිවීම.

✓ වර්තමාන ලෝකය නව තාක්ෂණික යුගයක් කරා ගමන් කරන බැවින් සෞන්දර්ය කලා විෂයන් වලට ඇති අවධානය අවම වීම හා වර්තමාන ශ්‍රී ලංකාවේ ඇති ආර්ථික අර්බුදය හා කලාවන් සඳහා රැකියා අවස්ථා අවමවීම හේතුවෙන් ප්‍රාසාංගික කලා විෂයන් අධ්‍යනයට යොමුවන පිරිස අවම වීම.

## පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

**6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය**

**ටවර් හෝල් රඟහල පදනම භාරකාර මණ්ඩලය - 2024**

**නිල බලයෙන් පත්වන සාමාජිකවරු**

| | | |
|---|---|---|
| 01 | ටවර් හෝල් රඟහල පදනමේ සභාපති/<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ<br>ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා | - 2022.07.20 – 2024.09.23 |
| | ටවර් හෝල් රඟහල පදනමේ සභාපති/<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ<br>ගරු අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය | - 2024.09.24 සිට |
| 02 | මුදල් ගරු රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමා<br>(මුදල් අමාත්‍යතුමන් නියෝජනය කිරීම) | - 2022.12.21 – 2024.09.22 |
| | මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු ගරු අමාත්‍යතුමා | - 2024.12.12 සිට |
| 03 | රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍ය<br>දිනේෂ් ගුණවර්ධන මැතිතුමා | - 2022.07.20 – 2024.09.23 |
| | රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍ය<br>ආචාර්ය චන්දන අබේරත්න මැතිතුමා | - 2024.12.12 සිට |
| 04 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය<br>විදුර වික්‍රමනායක මැතිතුමා | - 2022.05.20 – 2024.09.24 |
| | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය<br>ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමා | - 2024.12.12 සිට |
| 05 | අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක මහතා | - 2022.07.23 – 2024.09.23 |
| | අග්‍රාමාත්‍ය ලේකම් ජී. ප්‍රදීප් සපුතන්ත්‍රී මහතා | - 2024.12.12 සිට |
| 06 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ<br>ලේකම් සෝමරත්න විදානපතිරණ මහතා | - 2022.05.24 - 2024.05.31 |
| | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ<br>ලේකම් බුවනෙක හේරත් මහතා | - 2024.06.03 – 2024.09.24 |
| | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ<br>ලේකම් රංජිත් ආරියරත්න මහතා | - 2024.09.24 – 2024.11.19 |

| | | |
|---|---|---|
| 07 | අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්<br>වසන්තා පෙරේරා මහත්මිය<br>අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්<br>තිලකා ජයසුන්දර මහත්මිය | <br>- 2024.01.01 – 2024.03.31<br><br>- 2024.04.02 – 2024.11.19 |
| 08 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ<br>(ජාතික උරුම අංශය)<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ මහත්මිය | <br><br><br>- 2022.12.21 – 2024.10.30 |
| 09 | කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්<br>ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මිය | <br>- 2022.06.23 – 2024.11.03 |
| | කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්<br>පාලිත නානායක්කාර මහතා | <br>- 2024.11.04 දින සිට |

<u>**ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත්කරන සාමාජිකවරු**</u>

<u>**(පත්වීමේ දින සිට වසර 03 ක කාලයක් සඳහා)**</u>

| | |
|---|---|
| 01 සුනිල් සරත් පෙරේරා මහතා | - 2022.12.21 – 2024.10.15 |
| 02 චරිතා ප්‍රියදර්ශනී පීරිස් මහත්මිය | - 2022.12.21 – 2024.10.15 |
| 03 පාලිත සිල්වා මහතා | - 2022.12.21 – 2024.10.15 |
| 04 නඩරාජා කාර්තික් මහතා | - 2022.12.21 – 2024.10.15 |

- ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ටවර් හෝල් රඟහල පදනම.

<u>**මහා භාණ්ඩාගාර නියෝජනය**</u>

**මහා භාණ්ඩාගාර නියෝජනය**
රේණුකා කොළඹගේ මහත්මිය - 2022.12.21 – 2024.11.27
ප්‍රධාන මූල්‍ය නිලධාරී, මුදල් අමාත්‍යාංශය

<u>**ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්**</u>

| | | |
|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | - ආචාර්ය ඩී.එම්.එස් දිසානායක මහතා |
| 2. | අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන) | - නිපුණ දිසානායක මහතා |
| 3. | අධ්‍යක්ෂ ( නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන්) | - (පුරප්පාඩුව පවතී) |
| 4. | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | - කසුන් දේශප්‍රිය මහතා<br>2022.09.20 දින දිට 2024.03.04<br>- ඩබ්.ඩී.පෙරේරා මහත්මිය<br>2024.04.29 දින සිට 2024.09.29<br>- ඉමාල් සමරකෝන් මහතා<br>2024.10.01 දින සිට මේදක්වා |
| 5. | සහකාර අධ්‍යක්ෂ(පාලන හා සංවර්ධන) | - (පුරප්පාඩුව පවතී) |

6. නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (නාට්‍ය ප්‍රවර්ධන, කලාකරු සුභසාධන හා වැඩසටහන්) - චන්දන විජේසුන්දර බණ්ඩාර මහතා
7. සහකාර අධ්‍යක්‍ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්‍ෂණ) - (පුරප්පාඩුව පවතී)
8. සහකාර අධ්‍යක්‍ෂ (දෙමළ නාට්‍ය ප්‍රවර්ධන) - ආචාර්ය ෂම්මුග ෂර්මා මහතා

<u>**ටවර් හෝල් රඟහල පදනම - අනුමත කාර්ය මණ්ඩල තොරතුරු - 2024-12-31දිනට**</u>

| සේවා ගණය | වැටුප් **කේත** අංකය | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | HM-2-1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| | HM-1-1 | අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන සහ වැඩසටහන්) | 1 | 0 | 1 |
| | MM-1-1 | සහකා ර අධ්‍යක්ෂ (පාලන සහ සංවර්ධන) | 1 | 0 | 1 |
| | | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 1 | 1 | 0 |
| | | සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ) | 1 | 0 | 1 |
| | | සහකාර අධ්‍යක්ෂ) නාට්‍ය ප්‍රවර්ධන කලාකරු/ සුභසාධන හා වැඩසටහන්) | 1 | 1 | 0 |
| | | සහකාර අධ්‍යක්ෂ )දෙමළ නාට්‍ය ප්‍රවර්ධන) | 1 | 1 | 0 |
| \තෘතීය මට්ටම | JM-1-1 | පරිපාලන නිලධාරී | 1 | 1 | 0 |
| | | කළමනාකරු (රඟහල්) | 3 | 3 | 0 |
| | | අභ්‍යන්තර විගණන නිලධාරී | 1 | 1 | 0 |
| | MA-4 | සංවර්ධන සහකාර (අලෙවි) | 1 | 1 | 0 |
| | | සංවර්ධන සහකාර (ගිණුම් හා මූල්‍ය) | 1 | 1 | 0 |
| | | සම්බන්ධීකරණ නිලධාරී (පාඨමාලා) | 1 | 1 | 0 |
| | | සම්බන්ධීකරණ නිලධාරී වැඩසටහන් හා) (ප්‍රචාරණ | 1 | 1 | 0 |
| | | සම්බන්ධීකරණ නිලධාරී (සුභ සාධන) | 1 | 1 | 0 |
| | | ජ්‍යෙෂ්ඨ ශබ්ද පරිපාලක | 1 | 1 | 0 |
| ද්විතීය මට්ටම | MA-2-1 | වැඩ මූලික සිවිල් | 1 | 1 | 0 |
| | | තාක්ෂණික සහකාර | 1 | 0 | 1 |
| | | ශබ්ද පරිපාලක | 1 | 0 | 1 |
| | | පොත් තබන්නා | 1 | 1 | 0 |
| | MA- 1-1 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 26 | 16 | 10 |
| | | කළමනාකරණ සහකාර (මුදල් අයකැමි) | 1 | 1 | 0 |
| | | කළමනාකරණ සහකාර (දෙමළ භාෂිත) | 1 | 1 | 0 |
| ප්‍රාථමික මට්ටම | PL-3 | රියැදුරු | 6 | 3 | 3 |
| | | විදුලි කාර්මික ශිල්පී | 1 | 1 | 0 |
| | | ශබ්ද ක්‍රියාකරු | 4 | 1 | 3 |
| | | රංගාලෝක ශිල්පී | 3 | 3 | 0 |
| | | නඩත්තුරු | 1 | 1 | 0 |
| | PL-2 | රංගාලෝක ශිල්පී සහායක | 3 | 2 | 1 |
| | | කාර්යාල සහායක | 7 | 3 | 4 |
| | | රංගශාලා සහායක | 8 | 4 | 4 |
| | | පාලන මැදිරි සහායක | 1 | 0 | 1 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | PL-1 | රංග සේවා මැදිරි සහායක | 1 | 1 | 0 |
| | | කෞතුකාගාර ලේඛනාගාර සහායක / | 1 | 1 | 0 |
| | | ශබ්ද ක්‍රියාකරු සහායක | 3 | 3 | 0 |
| | | පොත් අලෙවිහල සහායක | 1 | 1 | 0 |
| | | එකතුව | 91 | 60 | **31** |

**පුද්ගලික වන සේ අනුමත තනතුරු**

| | | | | | |
|---|---|---|---|---|---|
| ද්විතියික මට්ටම | MA-2-1 | පරිගණක ක්‍රියාකරු | 01 | 01 | 0 |
| ප්‍රාථමික මට්ටම | PL-2 | කළමනාකාර සහායක | 02 | 02 | 0 |
| | | මුළු එකතුව | 94 | 63 | **31** |

කළමනාකරණ සහකාර එක් අයෙකු සහ රංගාලෝක ශිල්පීයෙකු වසර 05 ක වැටුප් රහිත විදෙස් නිවාඩු ලබා ඇත.

**ඉල්ලා අස්වීම් - 2024.12.31 දිනට**

| අංකය | නම | තනතුර | පත්වීම් දිනය | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|---|---|
| 01 | එස්.කේ. දේශප්‍රිය මහතා | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 2022-09-20 | 2024-03-04 |
| 02 | රන්දික ජයනිඳු මහතා | රංගාලෝක ශිල්පී සහායක | 2022-10-03 | 2024-04-16 |
| 03 | මධූෂා දේශානි මෙය | කළමනාකරණ සහකාර | 2019-08-01 | 2024-05-07 |

**විශ්‍රාම ගැනීම් - 2024.12.31 දිනට**

| අංකය | නම | තනතුර | පත්වීම් දිනය | විශ්‍රාම ගත් දිනය |
|---|---|---|---|---|
| 01 | ඩබ්.ඒ. සිරි අනුර උඩබේසිංහ මහතා | රංගශාලා සහායක | 1995-12-13 | 2024-05-31 |

**නව පත් කිරීම් - 2024.12.31 දිනට**

| අංකය | නම | පැවැති තනතුර | නව තනතුර | නව තනතුරට පත්කළ දිනය |
|---|---|---|---|---|
| 01 | ධනුෂ්ක නයනකුමාර මහතා | කාර්යාල සහායක | රංගාලෝක ශිල්පී | 2024-09-13 |

**වැඩ බැලීමේ තනතුරු සඳහා පත් කිරීම් - 2024.12.31 දිනට**

| අංකය | නම තනතුර සහ ආයතනය | වැඩ බලන ලද තනතුර | වැඩ බලන ලද කාලසීමාව |
|---|---|---|---|
| 01 | ඩබ්.ඩී. පෙරේරා මහත්මිය ගිණුම් නිලධාරී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 2024-04-29 සිට 2024-10-29 දක්වා |

බඳවා ගැනීම් - **2024.12.31** දිනට

| අංකය | නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|---|
| 01 | ටී.අයි.ඒ. සමරකෝන් මහතා | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 2024-10-01 |
| 02 | නෙෂාන් ධනුෂ්ක පෙරේරා | රංගාලෝක ශිල්පී සහායක | 2024-09-13 |

**6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආයකාරය**

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 91 ක් වන අතර නිත්‍ය කාර්ය මණ්ඩලය 63 ක් විය.ඒ අනුව පුරප්පාඩු වූ තනතුරු පහත පරිදි වේ.

01. අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන සහ වැඩසටහන්) 01

02. සහකාර අධ්‍යක්ෂ (පාලන සහ සංවර්ධන) 01

03. සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ) 01

04. තාක්ෂණික සහකාර 01

05. ශබ්ද පරිපාලක 01

06. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) 10

07. රියදුරු 03

08. ශබ්ද ක්‍රියාකරු 03

09. රංගාලෝක ශිල්පී සහායක 01

10. කාර්යාල සහායක 04

11. රංගශාලා සහායක 04

12. පාලන මැදිරි සහායක 01

වරින්වර නිකුත්කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව සහ ආයතනික වියදම් පරිපාලනය මත ඉහත සඳහන් තනතුරු සියල්ල බඳවා ගැනීමට නොහැකි විය.

එසේ වුවද අත්‍යවශ්‍ය තනතුරුවල අවශ්‍යතාවය පෙන්වා තනතුරු කිහිපයක් අලුතින් බඳවා ගැනීමට අනුමැතිය ගත්තද සුදුසු අයවලුන් ඉදිරිපත් නොවීම මත අධ්‍යකෂ(නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන්),සහකාර අධ්‍යක්ෂ(අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ),තාක්ෂණික සහකාර යන තනතුරු කිහිපයක් බඳවා ගැනීමට නොහැකි විය.

ඒ අනුව අධ්‍යකෂ(නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන්),සහකාර අධ්‍යක්ෂ(අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ) අත්‍යාවශ්‍ය තනතුරු බඳවා ගැනීමට නොහැකි වීම මත ටවර් හෝල් රඟහල පදනම මගින් පවත්වාගෙන යනු ලබන නාට්‍ය පාසල් වල හා සංරක්ෂණ කටයුතු සිදුකර ගැනීම ඉතා අසීරු විය.

එමෙන්ම තාක්ෂණික සහකාර තනතුර සඳහා ස්ථිර අයකු බඳවා ගැනීමට නොහැකිවීම මත ආයතනික කටයුතු ඩිජිටල්කරණයට ලක් කිරීමට අසීරු විය.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | වැඩසටහනේ ස්භාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|
| 01.JM හා MA නිලධාරින් සඳහා දෙමළ භාෂා පුහුණුව | 09 | පැය 150 | රු 19,800.00 | දේශීය | විවිධ ජන කොටස් සමග සම්බන්ධීකරණය පහසු වීම |
| 02.සිංහල භාෂා ප්‍රවීණතා පුහුණුව | 01 | පැය 150 | රු 5,113.64 | දේශීය | එම |
| 03.ප්‍රාථමික නිලධාරින් සඳහා දෙමළ භාෂා පුහුණුව | 07 | පැය 100 | රු 8,898.33 | දේශීය | දෛනික රාජකාරි කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට අවශ්‍ය දැනුම වර්ධනය වීම |

ආයතනයේ කටයුතු සඳහා ඍජුව දායකවන කාර්යමණ්ඩල සාමාජිකයන්ට ඉහත සඳහන් වැඩසටහන් මගින් ලබා දුන් පුහුණුව මගින් ඔවුන්ගේ විෂයානුබද්ධ දැනුම වර්ධනය කිරීමට හැකි විය.

ඒ හරහා ආයතනයේ කාර්යසාධනය ඉහල මට්ටමකට පත්වූ බව සඳහන් කළ හැකි අතර මෙම පුහුණු හරහා කාර්යමණ්ඩල සමාජිකයන්ගේ ආකල්ප ධානාත්මකව වර්ධනය වූ බැවින් ඔවුන්ගේ කාර්යක්ෂමභාවය වැඩිවීම හා නිවැරදිව තම කටයුතු ඉටු කිරීමට හැකි වීම ආයතනයේ අභිවෘද්ධියට පිටුවහලක් විය.

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල නොවේ | අර්ධ රාජ්‍ය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම ගිණුම් භාවිතා නොවේ | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල නොවේ | සියළුම මාසික ගිණුම් සාරාංශ අමාත්‍යාංශය වෙත යොමු කරන අතර අමාත්‍යාංශය මගින් අදාල වාර්තා මහා භාණ්ඩාගාරයට යොමු කරනු ලැබේ | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | විගණන හා කළමනාකරණ කමිටු 03 ක් පවත්වා ඇත. | 2025 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්වීමට සැලසුම් කර ඇත. |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | අනුකූල වේ | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | නිරවුල් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල නොවේ | අර්ධ රාජ්‍ය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම ගිණුම් භාවිතා නොවේ | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල නොවේ | අර්ධ රාජ්‍ය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම ගිණුම් භාවිතා නොවේ | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | බොහෝ තත්කාර්ය අතුරු අග්‍රිම මාසයක් තුල නිරවුල් කර ඇතත් ඇතැම් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් වී නොතිබිණි. ඉදිරියේදි මෙවැනි කටයුතු වැලැක්වීමට කටයුතු යොදා ඇත. | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල නොවේ | අර්ධ රාජ්‍ය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම ගිණුම් භාවිතා නොවේ | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල නොවේ | අර්ධ රාජ්‍ය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම ගිණුම් භාවිතා නොවේ | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල නොවේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | සකස් කරමින් පවතී. | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පවතී.ඒ තුලට මෙම පුරවැසි ප්‍රඥප්තිය ඇතුලත් කර සකස් කිරීමට නියමිතව ඇත. | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | ප්‍රතිපාදන සීමා වීම මත සියළු කාර්යමණ්ඩලයට පැය 12ක පුහුණුවක් ලබා දීමට නොහැකි විය. 2025 මෙය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | 2023.11.30 දිනැති 02/2018(I)රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03 ඡේදය අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් නොකරනු ඇත. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |